# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ඔක්තෝබර් 08 වන අඟහරුවාදා**
2013 ஒக்டோபர் 08 செவ்வாய்க்கிழமை
Tuesday 08th October 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.50 க்கு சபை கூடியது*
The Provincial Council met at 09.*50* a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# විගණකාධිපති වාර්තා : පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය : 2009
## AUDITOR GENERAL'S REPORTS : PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY: 2009

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සහ වාර්ෂික ගිණුම් පිළිබඳ වාර්තාව"* මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම වාර්තාවන් කාර්ය පටිපාටි රීති අංක 96(2) අනුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරනවා.

***ඊට අනුකූලව, ගරු සභාපතිතුමා විසින්ම එම විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන හැටියට සභා ලේකම්වරයාට නියෝග කරන ලදී.***
*Accordingly, the Council Secretary was ordered by the Hon. Chairman to refer the said Auditor General's Report to the Provincial Public Accounts Committee.*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මම මීට පෙරත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, විගණකාධිපති වාර්තාව පිළිබඳව මේ සභාවේ සාකච්ඡාවට භාජනය කරන්නය කියලා. හේතු ගණනාවක් තිබෙනවා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ට, මේ සභාවට (බාධා කිරීම්) මේ විගණකාධිපති වාර්තාව තුළ තිබෙන කරුණු සම්බන්ධව පුළුල් විධියට දැනුමක් ලබා ගන්න වෙනවා. කවුරුත් මේ වාර්තාව කියවන්නේ නැහැ. අපි ගන්න තීරණ කියවන්නේත් නැහැ.

ඒ නිසා ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් කාරුණික ඉල්ලීමක් කරනවා, විගණකාධිපතිතුමාගේ වාර්තාව සම්බන්ධව පුළුල් ලෙස සාකච්ඡාවක් කරන්න මේ සභාවට අවස්ථාවක් ලබා දෙන්නය කියලා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ. පසුගිය කාලයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධව සාකච්ඡා කරන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. ඔය ඇති. ඔබතුමා ඔයිට වැඩිය කථා කරන්න ඕනෑ නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සාකච්ඡාවක් අවශ්‍ය වීමට අපට හේතු ගණනාවක් තිබුණා. විශේෂයෙන් මේවායේ නාස්තිය පිළිබඳව. ඒ නිසා මේ ගරු සභාවේ මන්ත්‍රීවරු දැන ගන්නට ඕනෑ, ආයතන මොන තරම් දුරට පවතිනවාද? මූල්‍ය කළමනාකරණය කොහොමද සිද්ධ වෙලා තිබෙන්නේ? පරිපාලන කළමනාකරණය සිද්ධ වෙලා තිබෙන්නේ කොහොමද කියන එක පිළිබඳ වගකීමක් මේ සභාවට තිබෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සාකච්ඡා කරන්න ඔබතුමාට අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.09.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

*අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.*
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පානදුර, වලාන, ගාලුපාර, අංක 122/5 හි පදිංචි ජී.එම්. ප්‍රදීප් කුමාර යන අයගේ පෙත්සම සහ,

ii. අළුබෝමුල්ල, පමුණුගම, අංක 312 හි පදිංචි පී.එස්.ජේ. අභයපාල යන අයගේ පෙත්සම.

** [සභා මේසය මත තබන ලද පෙත්සම]*
*[Tabled petition]*

කෝකිලා හර්ෂනී ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමියගේ අත්සනින් යුත්,

මීරිගම, අමරතුංග මාවත, අංක 63 හි පදිංචි එච්.එච්.කේ. ප්‍රේමරත්න යන අයගේ පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම්, මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.*
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. පෙත්සම් කාරක සභාවට යොමු කරපු පෙත්සමක් පිළිබඳව දැනුවත් කිරීමට මා අවස්ථාව ඉල්ලා සිටිනවා. බුලත්සිංහල විවිධ සේවා සමූපකාර සමිතියට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගැනීම. ඒ පිළිබඳව මම මාර්තු මාසේ පෙත්සමක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව පෙත්සම් කාරක සභාවෙන් තීන්දුවක් අරගෙන තිබෙනවා.

*"ඉහත කරුණට අදාළව බුලත්සිංහල, රජයේ සේවක ගම්මානය, අංක 48 දරන ස්ථානයහි පදිංචි එච්.ඒ. පද්මසිරි මහතා විසින් බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රී කිත්සිරි කහටපිටිය මැතිතුමා මගින් බස්නාහිර පළාත් සභාවේ, මහජන පෙත්සම් කාරක සභාවේ, ගරු සභාපතිතුමා වෙත පෙත්සමක් ඉදිරිපත් කර ඇත. එම පෙත්සම 2013.04.02 දින බස්නාහිර පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ පෙත්සම බස්නාහිර පළාත් සමූපකාර අමාත්‍යාංශය වෙත යොමු කර නිරීක්ෂණ වාර්තාවක් ගෙන්වා ගැනීමට මහජන පෙත්සම් කාරක සභාව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් පෙත්සම ඔබ වෙත යොමු කරන අතර, ඒ පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මහජන පෙත්සම් කාරක සභාවේ ගරු සභාපතිතුමාගේ නියෝගය පරිදි මෙයින් කාරුණිකව දන්වමි."*

ගරු සභාපතිතුමනි, අපි ජනතාවගේ ඉල්ලීම මත ඔවුන්ගේ පෙත්සම්, පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනවා. එම කාරක සභාව ඒ පෙත්සම් ක්‍රියාත්මක කිරීමේ නිර්දේශ යොමු කරලා තිබෙනවා සමූපකාර අමාත්‍යාංශයට. නමුත් අද වන තෙක් මේ පෙත්සම් කාරක සභාවේ වාර්තාවක් ලබා ගෙන මේ පෙත්සමට අවශ්‍ය සමූපකාර මණ්ඩලයේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන්න ක්‍රියාත්මක කරලා නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ සභාපතීත්වයෙන් යුතුව තමයි අද අපව මේ සභාවට කැඳවන්න ඔබතුමා න්‍යාය පත්‍රය එවලා, ඒ අනුව අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. නමුත් ඔබතුමා කරන නියෝග අමාත්‍යාංශ වෙත යොමු කරලා ඒ වාර්තාව දෙන්න කිව්වාම මාස හයකට වැඩි කාලයක් ගත වෙලා තියෙනවා.

එහෙම නම් ඔබතුමා දරන මේ සභාපතීත්වයට ඒ ගරුත්වයට පිළිගැනීමක් නැහැ. ඒ නිසා මේ වාගේ දේවල් වෙන කොට ඔබතුමාගේ සභාපතිකම අපේ මන්ත්‍රීවරුන්ටත් පිළිගන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. එහෙම නම් ගරු සභාපතිතුමනි, මම මේ ලිපියේ පිටපතක් ආපහු සභාගත කරන්නම්.[1] වහාම මේ පිළිබඳව

---
[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ක්‍රියාත්මක වෙන්න. ඒ සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් අපව දැනුවත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මම වහාම සොයා බලා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමා අපි සාමාන්‍යයෙන් පෙත්සම් කාරක සභාවෙන් නිර්දේශ විතරයි ලබා දෙන්නේ. ඒ සම්බන්ධව නියෝග දීමක් සිදු කෙරෙන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ මොනවාවත් එවලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒ ගැන සොයලා බලන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මට යම් කාරණයක් දැන ගන්නට අවශ්‍යයි. දැන් අපි යම් අමාත්‍යාංශයකට සම්බන්ධව විශේෂ ප්‍රකාශයක් කළාම අදාළ අමාත්‍යාංශයෙන් ඒ විශේෂ ප්‍රකාශය සම්බන්ධයෙන් යම්කිසි තීන්දුවක් ගත යුතුව ඇතැයි කියලා මම කල්පනා කරනවා. ඒක එහෙමද ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් ඒක විෂය භාර අමාත්‍යතුමාගේ යුතුකමක්. ඒ ගැන සොයා බලලා ගරු මන්ත්‍රීවරයෙකුගේ ඉල්ලීමකට උත්තරයක් දෙන එක විෂය භාර අමාත්‍යවරයා විසින් කළ යුතු දෙයක්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැනට මාස තුනකට ඉස්සෙල්ලා සමූපකාර කොමසාරිස්වරයා පිළිබඳවත්, හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ ඇති වෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වය පිළිබඳවත් කාරක සභාවේ විරුද්ධත්වයක් නොතකා තොග ගබඩාව කඩලා වෙනත් එකක් හදනවාට සම්පූර්ණව විරුද්ධව තිබෙද්දීත් ඒක අද කර ගෙන යනවා. කොමසාරිස්වරයා අද කියනවා, කොමසාරිස්වරයාගේ අනුමැතියවත් අරගෙන නැහැයි කියලා. ඉතින් මේ සම්බන්ධව අපි විශේෂ ප්‍රකාශයක් කළාට, එය විශේෂ ප්‍රකාශයක් බවට මේ සභාව තුළ ගණන් ගැනෙන්නේ නැති තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලන්න කැමැතියි. අපි විශේෂ ප්‍රකාශයක් හැටියට කරන්නේ යම් වැදගත්කමකින් යුක්ත වූ කරුණක්. ඒ නිසා හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය අද සමූපකාර කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව තොග ගබඩාව කඩමින් තිබෙනවා. ඒ දැන් මේ අධ්‍යක්ෂ මණ්ඩලයක් අලුතින් පත් වෙන්න තිබෙද්දී. නඩුවක් නිසා තමයි ඒක දැන් නැවතිලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඔබතුමා කටයුතු කරන්න. මේක දැනට මීට මාස තුනකට පමණ ඉස්සෙල්ලා විශේෂ ප්‍රකාශයක් විධියට මම මේ සභාවේ කරපු දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් ගරු විපක්ෂ නායකතුමා, විශේෂ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී අදාළ ඇමතිතුමා ඒ කාරණය සම්බන්ධයෙන් එතුමාගේ අවධානය විශේෂයෙන් යොමු වෙන්න ඕනෑ. මම ඊට අමතරව සභා ලේකම්තුමා සමග ඉදිරියේදී -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒකට action එකක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ ඇමතිවරයා තමයි ඒ සම්බන්ධව තීන්දු කරන්න ඕනෑ. ඔබතුමාගේ ප්‍රශ්නය පිළිබඳව මම අවධානය යොමු කරනවා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## කැළ/හේනේගම විද්‍යාලය : ගස් 17 ක් කැපීම
KEL/ HENEGAMA VIDYALAYA: FELLING OF 17 TREES

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**01.**

**සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(1)13/14)**

අ. බ.ප/කැළ/හේනේගම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් පාසල් වත්තේ තිබූ තේක්ක, ලුණුමිදෙල්ල ඇතුළු ගස් 17 ක් කපා ලී මෝලකට යැවූ බව ඔබතුමා දන්නේ ද?

ආ. i. මෙම ගස් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් නිලධාරීහු කවුරුන්ද?

ii. අවසර ලබා දුන් ලිපිය සභාගත කළ හැකිද?

ඇ. i. මෙම විදුහලේ වාර්ෂිකව පවත්වනු ලැබූ "හේමප්‍රතිභා" සැණකෙළියේ 2011, 2012 වර්ෂයන් සඳහා ලැබුණු ආදායම කොපමණද?

ii. එම මුදල් තැන්පත් කර ඇත්තේ කිනම් ගිණුමකටද?

ඈ. i. 2012 වර්ෂයේ "හේමප්‍රතිභා" සැණකෙළියේ ආරාධිතයෙකු ලෙස සහභාගී වූ රජයේ අමාත්‍යවරයෙකු ලබා දුන් රුපියල් අනූ දහසේ චෙක්පත ගිණුම් කර ඇත්තේ කිනම් ගිණුමකද?

උ. i. මෙම උත්සවයේ ආරාධිතයෙකු වූ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ඇතුළු වෙනත් ආරාධිතයන් ලබා දුන් මුදල් තැන්පත් කරන ලද්දේ කිනම් ගිණුමකද?

ඌ. i. පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන මගින් මෙම විදුහලට ලබා දුන් බස් රථය සඳහා අමතර රුපියල් ලක්ෂ දහ තුනක මුදලක් විවිධ පුද්ගලයන්ගෙන් එකතු කළ බව ඔබතුමා දන්නේද?

ii. එම මුදලට සිදුවූයේ කුමක්ද?

එ. i. බප/කැළ/ හේනේගම විද්‍යාලයේ විදුහල්පතිවරයා පිළිබඳ පැවැත්වූ විගණන පරීක්ෂණයේ නිර්දේශය කුමක්ද?

ii. එම විගණන වාර්තාව සභාගත කළ හැකිද?

iii. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

අ. නොදනී.

මේ කාරණාව පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නම් ගරු සභාපතිතුමනි. නැත්නම් ආයිත් දිගින් දිගට ප්‍රශ්න අසන හින්දා. මේකේදී කාල සීමාවක් දීලා නැහැ, ගස් 17 කැපුවේ කොයි කාලේද කියලා. එහෙම වුණා නම්, අපට වඩා පහසු වෙනවා. නමුත්, ලුණුමිදෙල්ල ගස් පහක් පාසල මායිම ආසන්නයේ හා බාලක නේවාසිකාගාරය ආසන්නයේ තිබිලා තිබෙනවා. මායිම ආසන්නයේ සිටින නිවාස හිමියන්ගේ ඉල්ලීම හා බාලක නේවාසිකාගාරයට අනතුරු විය හැකි බැවින් මහර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත ඔරුගොඩවත්ත රාජ්‍ය දැව සංස්ථාව මගින් විධිමත්ව මෙම ලුණුමිදෙල්ල ගස් පහ ඉවත් කරලා තිබෙනවා. 2002 වර්ෂයේදී. 17 ක් ගැන නැහැ. ගරු මන්ත්‍රීතුමා, ගස් 05 ක් ගැන තමයි අපට තොරතුරු ලැබිලා තිබෙන්නේ. ඒ නිසා තමයි නොදනී කියලා දැම්මේ.

ආ. i. නොදනී. පළමුවන ප්‍රශ්නයට අදාළව තිබෙන නිසා.

ii. අදාළ නොවේ.

ඇ. i. 2011 වර්ෂයේ රුපියල් ලක්ෂ හතරයි.
2012 වර්ෂයේ පන් ලක්ෂ විසි පන්දහස් හතලිස් පහයි.

ii. පාසල් නගා සිටුවීමේ ගිණුමේ තැන්පත් කර ඇත.

ඈ. i. එවැනි මුදලක් ලබා දී නොමැත.

මෙතැන ප්‍රධාන ආරාධිතයකු වූ රජයේ අමාත්‍යවරයකු ලබා දුන් රු. 90,000/- චෙක්පත ගැන ප්‍රශ්නයක් අහන්නේ ගරු සභාපතිතුමනි. ලබා ගත් තොරතුරු අනුව එවැනි මුදලක් ලබා දීලා නැහැ. හැබැයි, දින පහක කාල සීමාව තුළ විවිධ ඇමතිවරු සහභාගී වෙලා තිබෙනවා. ඉතින් අපට ඒක සොයා ගන්න විධියක් නැහැ. කොයි කාරණාවද කියන එක.

උ. i. මහර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සහන් ප්‍රදීප් මහතා විසින් ගුරු සුභ සාධන සංගමයට රුපියල් විසි දාහක් පරිත්‍යාග කර ඇති අතර, එදින ලෝක ළමා දිනය බැවින් එය යොදා ගෙන 20,930 ක අයිස්ක්‍රීම් සිසුන්ට ලබා දී ඇත.

ඌ. i. බස් රථය මිලදී ගැනීම සඳහා අමතර රුපියල් ලක්ෂ දහ තුනක මුදලක් ආදි ශිෂ්‍ය සංගමය විසින් උපයාගෙන ඇත.

ii. පළාත් සභා මන්ත්‍රී දිලිප් කුමාර රාජපක්ෂ මැතිතුමා විසින් එතුමාට වෙන් වූ ප්‍රතිපාදනවලින් ලබා දුන් ලක්ෂ 35 ක මුදලින් බස් රථය මිලදී ගෙන ඇති බැවින් ආදි ශිෂ්‍ය සංගමය එකතු කළ මුදල රුපියල් ලක්ෂ 10 ක් දිලිප් කුමාර රාජපක්ෂ පදනමට පරිත්‍යාග කර ඇත. එම මුදලින් ලක්ෂ 10 ක් වටිනා භාණ්ඩ ආධාර පාසලට ලබා දී ඇත.

එ. i. විදුහල්පතිවරයා පිළිබඳ විගණන පරීක්ෂණයක් පවත්වා නැත.

ii. අදාළ නොවේ.

iii. අදාළ නොවේ.

ගරු සභාපතිතුමනි, විදුහල්පතිවරයා පිළිබඳව පරීක්ෂණයක් පවත්වා නොමැති අතර, 2011 වර්ෂයේදී පාසල සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විගණනය කර ඇත. මෙම විගණන විමසුමේ සියලුම ඡේදවලට, 2013.10.07 වන විට පළාත් අධ්‍යක්ෂ විසින් විගණකාධිපති වෙත පිළිතුරු සපයා ඇත. 2012 දී පාසලේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳව ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයෙන් විගණනයක් සිදු කරන අතර, එය මෙතෙක් අවසන් වී නොමැත.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරපු ඒ විගණන වාර්තාව දැන් මගේ අතේ තිබෙනවා. විගණන වාර්තාවට අනුව සම්පූර්ණයෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්න තුනක් යොමු කරන්න පුළුවන්, එතුමා ලබා දුන් පිළිතුරු සම්බන්ධව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒ විගණන වාර්තාව සම්බන්ධයෙන් මට මතුවන ප්‍රශ්න ටික එකින් එක ඉදිරිපත් කිරීමේදී අතුරු ප්‍රශ්න තුනට පමණක් සීමාවී ඉදිරිපත් කර ගන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඒ තරම් දූෂණ වංචා ටිකක් මෙතැන සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉදිරි උපදේශක කාරක සභාවේදී මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට මට අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පුළුවන් නේ? ඒ අවස්ථාව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඔබතුමාට ලබා දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවශ්‍ය නම් මේ අවස්ථාවේ ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ප්‍රශ්න ඇහුවත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ වෙලාවේ උත්තර දෙන්නත් බැහැ. මම අතුරු කාරණයක් මතු කරනවා. එතුමාගේම වැඩ සටහනක් වුණු සුපසන් නිම්තෙර වැඩ සටහන සම්බන්ධයෙන් මෙතුමා අනුගමනය කරපු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්. සුපසන් නිම්තෙරට මුදල් වෙන් කරන්නේ ගරු සභාපතිතුමනි, අදාළ නිශ්චිත කාර්යයක් සඳහා. ඒ කියන්නේ, පාසල්වල වර්ණ ආලේප කිරීම සඳහා. නමුත් මේ මුදල් එතුමාට ඕනෑ පරිදි වෙනස් කර ගෙන තිබෙනවා. පළාත් සභාවේ නිලධාරීන්ගේ හෝ කිසිදු අනුමැතියකින් තොරව. කලාප අධ්‍යක්ෂතුමාගේ හෝ අනුමැතියකින් තොරව. ඉතින් එහෙම කරන්නේ ඇයි? එහෙම කරන්න හේතුවත් මම දකිනවා ගරු සභාපතිතුමනි. එතුමාගේ වාහන ගමන් බිමන් පාවිච්චිය සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂයෙන් පිට යන්නේ. දැන් මෙතැනට ඒ ප්‍රශ්නය අදාළ නැහැ. ඔබතුමා අහන ප්‍රශ්නවල ඒ කාරණය සම්බන්ධයෙන් නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මම ප්‍රශ්නයක් ලෙස ඇහුවේ එහෙම පුළුන්ද කියන කාරණය. සුපසන් නිම්තෙරට වෙන් කළ මුදල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය එහෙම නම් අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මම දෙවැනි ප්‍රශ්නයත් ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, විදුහල්පතිතුමාගේ සමහර ගමන් වාර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාවේ පෞද්ගලික කථා බහ නතර කරන්න. මන්ත්‍රීවරයෙක් කියන කිසිම දෙයක් ඇහෙන්නේ නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. වාහනය භාවිතා කළේ කුමන ගමන් වාරයක් - දැන් වාහනයක් පාවිච්චි කළාට පස්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අදාළ ප්‍රශ්නයට අනුව නොවෙයි ඔය අහන්නේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේක මෙහෙම ඉදිරිපත් කරන්නම්. ප්‍රශ්න හැටියට ඉදිරිපත් කළොත්-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙම නම් අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී ඔය ප්‍රශ්නය කථා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේකේ මම එක කාරණයක් කියන්නම්. සම්පූර්ණයෙන්ම මේ වාර්තාවේ තිබෙන්නේ, ඩුලිප් විජේසේකර ඇමතිතුමා හමුවීමට යාම. නමුත් මේවායේ කිසිදු මාර්ග සටහනක් ලියලා නැහැයි කියලා තමයි වාර්තාවේ තිබෙන්නේ. ඉතින් එහෙම වාහන පාවිච්චි කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මම එතුමාගෙන් අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ සම්බන්ධව අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ස්තුතියි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ, ඔබතුමාත් අදහස් කරන දෙයක්. නිදහස් අධ්‍යාපනය මේ රටට සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා හඳුන්වා දුන්නාට පස්සේ - මම හිතන්නේ, මෙතැන ඉන්න බොහෝ දෙනෙක් මේ නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය වූ දරුවෝ. ඒ නිසා අපට අයිතිවාසිකමක් තිබෙනවා, විශේෂයෙන්ම මේ රටේ ශිෂ්‍ය පරම්පරාව පිළිබඳව - බස්නාහිර පළාතේ දහසකුත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව අපේ හඬ මේ සභාවේ නගන්න. විශේෂයෙන්ම, මේ පහේ ශිෂ්‍යත්වය කියන එක අද මම හිතන්නේ දෙමව්පියන්ට, විශේෂයෙන්ම අම්මලාට, තාත්තලාට, දරුවන්ට, ගුරුවරුන්ට සහ සමස්ත සමාජයටම විශාල හිසරදයක් බවට පත් කරලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි එකක් මාධ්‍ය. මාධ්‍ය මගින් ඕනෑවටත් වඩා මේ පහේ ශිෂ්‍යත්වය කියන එක පිළිබඳව අනවශ්‍ය ප්‍රචාරයක් විධියට දීලා තිබෙනවා. අද ළමයින් අතර තරගයක් ඇති කරලා තිබෙනවා. ඒ තරගයට මම හිතන්නේ අම්මලා තාත්තලා නිතැතින්ම දායක වෙලා තිබෙනවා. ඒ සඳහා පෝස්ටර්, එහෙමත් නැත්නම් පුවත්පත් දැන්වීම්, රූපවාහිනී දැන්වීම් දාලා, මේ ශිෂ්‍යත්වය තරගයක් බවට පත් කරලා, ළමයින්ව අද තරගකාරී ධාවන තත්ත්වයට මම හිතන්නේ, අශ්වයෝ බවට පරිවර්තනය කරලා තිබෙනවා. එහෙම වෙලා මේවාවලින් ජයගත් දරුවෝ ඉන්නවා. ඒ දරුවන්ව අගය කිරීමක් කරනවා. වර්ගීකරණයක් කරනවා. එහෙම වුණාම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල නිසා අපහසුතාවයට පත් වන දරුවෝ කොට්ඨාශයක් ඉන්නවා. මේක මේ මෙවර ශිෂ්‍යත්ව විභාගයේදී විතරක් සිද්ධ වූ දෙයක් නොවෙයි. මේවා කලිනුත් සිද්ධ වුණා. නමුත් අපි දැකලා තිබෙනවා, මේ ප්‍රතිඵලවලින් පස්සේ මේ දෙමව්පියෝ මේ දරුවන්ට සලකන ආකාරය. විශේෂයෙන්ම මම දැක්කා ඊයේ පෙරෙයිදා දවසක පුවත්පතක තිබුණා, එක තාත්තා කෙනෙක් මේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල දැකලා තමන්ගේ දරුවාව පුච්චලා. මෙවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ, මම හිතන්නේ අද අනවශ්‍ය විධියට මේ විභාගයට වුවමනාවටත් වඩා ප්‍රචාරයක් ලබා දීම නිසයි. අපි දන්නවා. මේ ශිෂ්‍යත්වයේ අරමුණ දුප්පත් දරුවෝ. විශේෂයෙන්ම දුප්පත් දරුවන්ට, එදිනෙදා ඒ අධ්‍යාපන කටයුතු නිසි ලෙස කර ගන්න බැරි, විශේෂයෙන් දක්ෂ දරුවන්ට රජයේ ආධාර ලබා දීම තමයි මීන් සිදුවන්නේ. ඒක අගය කිරීමක් තමයි කරන්න ඕනෑ. නමුත් අද වෙලා තිබෙන්නේ මේක තරගයක් බවට පරිවර්තනය කරලා මේ දරුවන්ව මානසික වශයෙන් පීඩාවට පත් කරලා තිබීමයි. ඒකේ හොඳම හරිය තමයි ලෝක ළමා දිනය දවසේ මේ ප්‍රතිඵල නිකුත් කිරීම. අධ්‍යාපන ඇමතිවරයාට ඒක කොපමණ කිව්වත්, එතුමා දැඩි ප්‍රතිපත්තියක ඉන්නවා. ලෝක ළමා දිනය දවස තමයි මේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල එන්න හොඳම දවස කියලා එතුමා තීරණය කරනවා. හැබැයි, ඊට දවස් දෙකකට කලින්වත් මේක දුන්නොත් සමහර විට ළමයින්ව අගය කිරීම ලෝක ළමා දිනය දවසේවත් කරන්න පුළුවන්. ඒක වර්ගීකරණය කර ගෙන කරන්න පුළුවන්. ලකුණු මට්ටම අනුව. මම දන්නවා, විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාත් සභාවේ තිබෙන පාසල්වල - ජාතික පාසල්වලට වඩා, මධ්‍යම ආණ්ඩුවේ පාසල්වලට වඩා අපේ පළාත් පාසල්වල දරුවන්ගේ අධ්‍යාපන මට්මට හොඳයි. අනික් ඒවාට සාපේක්ෂව. ඉතින් ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාතික පාසල් වැඩක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔව්. ඇත්ත වශයෙන්ම මේ බස්නාහිර පළාතේ තිබෙන ජාතික පාසල්වලට වඩා මේ බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙන පාසල් හොඳයි. ඒ නිසා මේ ප්‍රතිඵල දෙන දිනය, තවත් විධියකට ඒ දරුවන්ව මානසික පීඩනයකට පත් කරනවා. ඒක ලෝක ළමා දිනය. ළමයින්ගේ අයිතිවාසිකම් තිබෙන දවස. ළමයි ගැන කථා කරන දවස. ළමයි ගැන අඩු ගණනේ අවුරුද්දකට සැරයක්වත් මම හිතන්නේ, වැඩ සටහනක් කරන දවස. එදාට ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් කරලා මේ ළමයින්ව මානසික වශයෙන් පීඩාවට පත් කරනවා. ඒ පීඩාව කොපමණද කියනවා නම් මේ ළමයි අද - එක ළමයෙක් මම දැක්කා ගෙදරින් එළියට බැහැලා යනවා, ලෝක ළමා දිනය දවසේ ප්‍රතිඵල ඇවිල්ලා. ඒ නිසා අපි කියන්නේ, ශිෂ්‍යත්ව විභාගය පැවැත්වුවාට

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

කමක් නැහැ. නමුත් වුවමනාවට වඩා මේ දෙන ප්‍රචාරය නතර කරලා, මේ ප්‍රතිඵල නිකුත් කරන දිනය ලෝක ළමා දිනය නොව, ඊට දවස් දෙකකට කලින්වත් දුන්නොත් මම හිතන්නේ ඒ ළමයින්ව අගය කිරීමට සහ එයින් අසමත් වන එහෙම නැත්නම් අඩු ලකුණු ගන්න ළමයින්ට යම්කිසි සහනදායී වැඩ සටහනක් දියත් කරන්න පුළුවන් කියන අදහස මතක් කරමින්, මේ ප්‍රතිඵල ලබා දෙන දිනය වෙනස් කරන්න කියන ඉල්ලීම මම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ඒ.එම්. යූසුෆ් මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A. M. Yoosuf

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. කරුණාකරලා ඔබතුමාගේ ආසනයට යන්න. ඔබතුමා වෙනත් ආසනවල ඉඳලා බාධා කිරීම් කරනවා. (බාධා කිරීම්) කරුණාකරලා මෙතුමාට අවස්ථාව ලබා දෙන්න. ඔබතුමන්ලා අනවශ්‍ය බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා ආසනයෙත් නැහැ. ඔබතුමා කොහේද ඉන්නේ? ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කරුණාකරලා ඉල්ලා සිටිනවා, සභා ගර්භය තුළ පෞද්ගලික සාකච්ඡා කිරීම් කරන්න එපා. එහෙම නම් කරුණාකරලා මන්ත්‍රීතුමන්ලා එළියට යන්න. එළියට ගිහිල්ලා සාකච්ඡා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා කියන දේ අහලා එතුමා යන්නේ නැහැ සීට් එකට. එතුමා එතැනම ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කමක් නැහැ. හිටියාට ප්‍රශ්නයක් නැහැ. ඉන්න පුළුවන් එතුමාට. කථා කරන්න බැහැ. ඉන්න බැරි කමක් නැහැ. කථා කරන්න, බාධා කිරීම් කරන්න බැහැ. යූසුෆ් මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නය මතු කරන්නේ මතුගම කොට්ඨාශයේ දොඩංගොඩ ග්‍රාමීය රෝහල සම්බන්ධයෙන්. ඒ ග්‍රාමීය රෝහල පසුගිය කාලේ වැඩි දියුණු කරලා, අපේ සෞඛ්‍ය ඇමතිතුමා ඒක පර්යන්ත රෝහලක් බවට පරිවර්තනය කළා. ඒ පසුගිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔය පෞද්ගලික සාකච්ඡා නතර කරන්න. ඔබතුමාට අවශ්‍ය නම් එළියට යන්න. සභාවෙන් පිටතට ගිහිල්ලා සාකච්ඡා කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ එතැන. ගරු මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව දෙන්න. (බාධා කිරීම්) හැමෝටම තමයි මම කියන්නේ. මම දැක්කේ එතැන - කරුණාකරලා ගරු මන්ත්‍රීවරුන් පෞද්ගලික සාකච්ඡා මේ සභා ගර්භය තුළ කරන්න එපා. අවස්ථාව ලබා දෙන්න ගරු මන්ත්‍රීතුමන්ලාට.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A. M. Yoosuf

ගරු සභාපතිතුමනි, පසුගිය සතියේ මේ රෝහල රාත්‍රී කාලයේ වහලා දැම්මා. මම ස්තුතිවන්ත වෙනවා හිරු මාධ්‍යයට. හිරු රූපවාහිනියට මම ස්තුතිවන්ත වෙනවා. ඒක ඉතාම පැහැදිලිව ප්‍රදර්ශනය කළා. ඒ රෝහලේ බෝඩ් එකක් දාලා තිබුණා, වෛද්‍යවරු නැති නිසා රාත්‍රී කාලයේ ලෙඩ්ඩු භාර ගන්නේ නැහැයි කියලා. ඒ වාට්ටුවේ ලෙඩ්ඩු 17 දෙනෙක් හිටියා. ඒ අයවත් ගෙදර යවලා. එක සේවිකාවක් පමණයි හිටියේ. ඒ සේවිකාවගෙන් ප්‍රකාශයක් ඉදිරිපත් වුණා. මම අහගෙන හිටියා. විශේෂයෙන්ම ග්‍රාමීය රෝහලක් ඒක. ඒ රෝහල වැඩි දියුණු කිරීමේ තේරුමක්වත් නැති වෙනවා. මේ වෛද්‍යවරු හිඟයක් නිසා. මේ යන්නේ සෞඛ්‍ය සතිය. කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ. වෛද්‍ය හිඟය නිසා දොඩංගොඩ රෝහලේ රාත්‍රී සේවාව නවත්වලා. ඒ ප්‍රදේශයේ අහිංසක අසරණ මිනිස්සුන්ට හදිස්සියකට රෝහලට යන්න විධියක් නැහැ. එහෙම නම් ඔබතුමාගේ මාර්ගයෙන් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් සහ ඒ බලධාරීන්ගෙන් අපි ඉල්ලීමක්

කරනවා, වහාම අවශ්‍ය වෛද්‍යවරු ඒ රෝහල සඳහා පත් කරන්න කියලා. රෝගීන්ව අපහසුතාවයට පත් කරන්න එපාය කියන ඉල්ලීම තමයි ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉල්ලීමක් කරන්නේ. බොහොම ස්තූතියි.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය මැතිවරණ කොට්ඨාශයේ සිටින මහජන සේවකයකු හැටියට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට පැළියගොඩ සිට ආරම්භ කරන ලද, දැන් වැඩ නිම වෙමින් පවතින, නොබෝ දිනකින් විවෘත කිරීමට සූදානම් කර ඇති අධිවේගී මාර්ගය, අතිගරු ජනාධිපතිතුමා නමින් නම් කළ යුතු යැයි බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික්කයේ සියලු මැති ඇමතිවරුන් - ගරු මහ අමැතිතුමා, පළාත් සභා මන්ත්‍රීවරු, නගර සභා ප්‍රාදේශීය සභා සභාපතිවරු සියලු දෙනාම ඒකමතිකව තීරණය කළා. ඒ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් - ආර්ථික සංවර්ධන කටයුතු ඇමතිතුමා. අපේ දිස්ත්‍රික් නායකතුමා. විශේෂයෙන්ම අතිශය සන්තෝෂ වෙනවා කැලණියේ ජනතාව. ලෝකයට මව්බිම පෙන්වන ප්‍රවේශය පැළියගොඩින් තමයි පටන් ගන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒකේ තිබෙන්නේ චීන අකුරු. පේන්නේ නැහැ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඒක රජමහා කැලණියේ ජනතාවට ලොකු අභිමානයක්. මේගොල්ලන්ගේ කුඩුකේඩු කම, කුහකත්වය. මේ වාගේ වැදගත් දේකටවත් ඉවසාගෙන ඉන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. චීන අකුරු කියවන්න දන්නේ නැහැ අපි. ඒකයි.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඒ ප්‍රවේශය කැලණිය මැතිවරණ කොට්ඨාශයේ පැළියගොඩින් තමයි ලබා දීලා තිබෙන්නේ. ආර්ථික වශයෙන් වැදගත් සංවර්ධන වැඩ පිළිවෙළක්. මේ තුළින් ලොවම පෙන්වන්නේ කැලණි මැතිවරණ කොට්ඨාශයේ පැළියගොඩින්. ඒ නිසා විශේෂයෙන්ම රජ මහා කැලණියේ ජනතාවත්, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවත් අතිගරු ජනාධිපතුමාටත්, බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ මාර්ගය නොබෝදා සැලසුම් කර ඇති ජාතීන්ගේ සංවිධානයට භාවිතා කිරීමට ලැබීම ලොකු සතුටක්. මේ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ඉතාම අඩු වියදමකින්, අනවශ්‍ය වියදමකින් තොරව මේ ජාතීන්ගේ සංවිධානයත් සැලසුම් කරලා තිබෙන්නේ. රටට, ලොවට අපේ රට පිළිබඳව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් මේ පාර ගැන නොවෙයි නේ කථා කරන්නේ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳව ලොවට පෙන්වන්න පුළුවන් අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. මේ වන විට මුළු රටටම හොඳ සංවර්ධන ප්‍රවේශයක් හැටියට, මාර්ගයක් හැටියට නිර්මාණය කිරීම පිළිබඳව අපි පළාත් සභාව හැටියටත් අතිගරු ජනාධිපතිතුමාට ස්තූතිවන්ත වෙන්නට ඕනෑ. රටක සංවර්ධනය වේගයෙන් යන කොට ශරීරයක නහර පද්ධතිය වාගේ රටක හොඳ මාර්ග පද්ධතියක් ඕනෑ. මේ මාර්ගය නැතිව කටුනායක ඉඳලා එන විදේශිකයෝ, සංචාරකයෝ, ආයෝජකයෝ මොන තරම් අපහසුතාවයකට පත් වුණාද? ලංකාව පිළිබඳ අපවාදයට ලක් කළාද? නමුත් දැන් එහෙම නොවෙයි. එය එක්සත් ජාතික පක්ෂය, සන්ධානය වේවා සියලු දෙනාටම ලාංකිකයන් හැටියට ගෞරවයක්. ඒක තක්සේරු කර ගන්න බැරි විශාල වටිනාකම් ඇති දෙයක්. මේ අයගේ මේ කුහකත්වය.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ. නහර චීන්නුන්ගේ. ඒකයි කිව්වේ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

මේ වන විට ශිරාල් ලක්තිලකට පොලුවලින් පහර දීලා. එතුමාත් නැහැ අද. ඒවා ගැන කනගාටු වෙනවා.

[ ගරු රෙහෙන්සිරි වරාගොඩ]

ඔබතුමන්ලා ගැන කනගාටු වෙනවා. මෙවැනි අවස්ථාවකදී ඉතාමත් ඉවසීමෙන් සංවරව, හරි දේ හරියි කියන්න බැරි පළාත් සභා මන්ත්‍රීවරු පිළිබඳව. (බාධා කිරීම්) ඒ නිසා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම මෙය පැහැදිලි කරන්න හේතු වුණේ, අපේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රකාශයක් කරන්න සිදු වුණා, මොකද, මේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල ප්‍රමාද වෙනවා කියලා. මෙයිනුත් වෘත්තීය සමිති නායකයන්, අනිකුත් පක්ෂ දේශපාලන උවමනාවන් ඉෂ්ට කරගන්න ලොකු උත්සාහයක් දැරුවා. ඒ නිසා ගරු අමාත්‍යතුමා ජාතික ප්‍රතිපත්තියක් හැටියට මෙය හදන්න ඕනෑ නිසා අපේ ලෝක ළමා දිනය දවසට ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් කරන්න ඕනෑ කියලා තීන්දුවක් ගත්තා. ඉතින් ඒ තුළ අපි දැක්ක අඩුපාඩුවක් තිබුණා. ඒ අඩුපාඩුව තිබුණු නිසා, ප්‍රතිඵල ලෝක ළමා දිනයේදී ඉදිරිපත් කළත්, වෙනත් දිනයක ඉදිරිපත් කළත් මේ ගැටලුව සිදු වෙනවා. මේ ගැටලුව ඇත්තටම දෙමව්පියන්ගේ මානසිකත්වය හදන්න ඕනෑ තැනක් මෙතැන. මොකද, ඒ අයව දැනුවත් කරන්න ඕනෑ තැනක්. ඒ නිසා මම කියනවා. ලෝක ළමා දිනයේදී මේ වුණු සිදුවීම් එක්ක, අපි පුවත්පත්වල දැකපු සිදුවීම් එක්ක ලෝක ළමා දිනයේදී මෙම ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සුදුසු නැහැයි කියන එකයි අපෙත් මතය වන්නේ. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අපි ඉල්ලීමක් කරනවා. පැහැදිලිවම ලෝක ළමා දිනයේදී පහේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද කරලා, ඊට පසු දිනක නිකුත් කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම දෙමව්පියන්ව මේ මානසිකත්වයෙන් මුදවා ගන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා මේත් එක්කම මම ඉල්ලා සිටිනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, විශේෂ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව. මම හිතන්නේ, ඊයේ අපේ රටේ ජාතික සමගිය පිළිබඳව යම්කිසි හොඳ සංඥාවක් ලැබුණු දිනයක් හැටියට ඉතිහාසයට එක් වුණායි කියලා මා විශ්වාස කරනවා. පසුගිය පළාත් සභා මැතිවරණයේ උතුරු පළාත් සභාවත්, වයඹ සහ මධ්‍යම පළාත් සභා මැතිවරණයත් පැවැත්වීමෙන් අනතුරුව උතුරේ මහ ඇමැතිවරයා දිවුරුම් දීම සම්බන්ධව විවිධ මතවාදයන් මාධ්‍යවලත්, ඒ වාගේම දේශපාලන ක්ෂේත්‍රයේත් කථිකාවට ලක් වුණා. ඒ සියලුම මතවාදයන් කොයි ආකාරයට පළ වුණත් අවසානයේදී තේරී පත් වුණු මහ ඇමැතිවරයා හැටියට එතුමා TNA සංවිධානයේ නායකයින් සමග අතිගරු ජනාධිපතිතුමන් ඉදිරියේ දිවුරුම් දීම සඳහා වැඩ පිළිවෙළක් යෙදුවා. එහිදී මම විශේෂයෙන් මතක් කරනවා, අතිගරු ජනාධිපතිතුමා සුහදශිලීත්වයේ, මිත්‍රත්වයේ දෑත පළමුව දිගු කළා. විවිධ ක්ෂේත්‍රයන් විවිධ කථා කියද්දී අතිගරු ජනාධිපතිතුමා විදේශගත වෙලා ඉදිද්දිත් එතුමා ප්‍රකාශයක් කළා යම්කිසි ආකාරයකින් දිවුරුම් දීම සඳහා සූදානම් නම් මම කැමැතියි ඒ දිවුරුම් දීමේ කටයුතු සංවිධානය කරන්න කියලා. ඒ අනුව උතුරේ මහ ඇමැතිවරයා හැටියට විග්නේෂ්වරම් මැතිතුමා ඊයේ දිවුරුම් දුන්නා. ඒ වාගේම ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ - TNA සංවිධානයේ නායකයනුත් ඒ සඳහා සහභාගී වුණා. මෙහිදී විවිධ හැල හැප්පීම් ඒ උතුරේ පළාත් සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරු අතර තිබෙනවා. ඒක නැතුවා නොවෙයි. විශේෂයෙන් මාධ්‍ය ඔස්සේ වාර්තා වන ආකාරයට එලියන්ගේ බිරිඳ මේ සම්බන්ධව දැඩි විරෝධයක් පළ කරලා තිබෙනවා. මම හිතන්නේ, ඊයේ සහභාගී වුණේ නැහැ. මම නිවැරුදියි.

**ගරු කුමරගුරුබරන්**
Hon. Kumaragurubaran

නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එවැනි තත්ත්වයන් තුළත් ඒ සියලුම මතවාදයන් කොයි ආකාරයට පළ වුණත් ඊයේ ප්‍රධාන අමාත්‍යවරයාගේ දිවුරුම් දීම මම හිතන්නේ, අපි බලාපොරොත්තු වන ජාතික සමගිය ගොඩ නැංවීම සඳහා මේ රට තුළ ඉතාම හොඳ ආරම්භයක් වෙයි කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම මේ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය පරාජය කරමින් TNA සංවිධානය විශාල ජයග්‍රහණයක් ලැබුවා. එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද ප්‍රමාණයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලැබූ ඡන්ද ප්‍රමාණයත් කවුරුන් හෝ ප්‍රමාණාත්මකව තක්සේරු කරන්න සූදානම් වෙනවා නම් ඒක ඒ තරම් සදාචාරාත්මක නැහැයි කියලයි මම විශ්වාස කරන්නේ. මොකද, ත්‍රස්තවාදය පැවතුණු

ප්‍රදේශයක, යුද්ධය පැවතුණු ප්‍රදේශයක මේ පක්ෂ දෙකම මුළු රටේම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ දෙකක් හැටියට, පවතින එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මේ මැතිවරණය ආරම්භ කළේ, බිංදුවේ ඉඳලා. එතකොට බිංදුවේ ඉඳලා ආරම්භ කළාම යම් ඡන්ද ප්‍රමාණයක් ලබාගෙන මේ මැතිවරණයේ තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න උත්සාහක් ගත්තා නම් විශේෂයෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් මම හිතන්නේ අපි එය අගය කරන්නට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තහවුරු කරන්නට ගත් ආරම්භයක් හැටියට ඒ පක්ෂ දෙකට අපි සියලු දෙනාගේ ගෞරවය, ප්‍රණාමය පිරිනමන්න ඕනෑ.

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, මෙතෙක් කල් අපට තිබුණු ප්‍රශ්නය තමයි උතුරේ ප්‍රශ්න සම්බන්ධව, උතුරේ මහජන නියෝජිතයින් සමග කථිකාවතක් දකුණේ ගොඩ නගන්න නොහැකි වීමයි. ඒ නිසා උතුරේ කථිකාවත හැම වෙලාවේම ජාත්‍යන්තරකරණය වීමක් තමයි සිද්ධ වුණේ. ඒ නිසා ඊයේ මම දකින විශේෂත්වය තමයි ඒ ජාත්‍යන්තරකරණය වුණු උතුරේ ප්‍රශ්නය දකුණේ රට තුළ කථා කරන්න පුළුවන් අවස්ථාවක් දීමයි. මම හිතන්නේ, ඒක බිඳ දමන්න නරකයි. ඒක අපි සියලු දෙනාගේ වගකීමක්. කුමන දේශපාලන මතවාදයන් අප දැරුවත් අපි සියලු දෙනා ඒකට බාධා නොකර ඒ මතවාදයන් කුමක් වුවත් රටේ අනාගත දරුවන් වෙනුවෙන් ඒ ගොඩනැගුණු, ඊයේ ඇති වුණු ආරම්භය හොඳ ආරම්භයක් හැටියට මේ රට තුළ ව්‍යාප්ත කරන්නට අවශ්‍ය සහයෝගය, ශක්තිය අපි ලබා දෙන්න ඕනෑ. ඔවුන් කියන දේවල් සියල්ලම අපට දෙන්න බැරි වේවි. අපි කියන සියලු දේවල් ඔවුන් අසන්න සූදානම් නැති වේවි. හැබැයි, අපට පුළුවන් වේවි යම් කථිකාවතක් තුළින් යම් මධ්‍යස්ථ තැනකට එන්නට. ඒ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට, අනාගතයේ මේ රටේ නැවතත් බෝම්බ පුපුරණ සමාජයක් බිහි වීම වළක්වන්නට යම් අඩිතාලමක් ඒ තුළ ගොඩ නැගේවී. ඒකට හොඳ පසුබිමක් ඊයේ ඇති වුණයි කියන එක මම දේශපාලන වශයෙන් විශ්වාස කරනවා. ඒ නිසා වසර ගණනාවක් අපේ දේශපාලන ජීවිත තුළ අපි අපේක්ෂා කළ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැංවීමේදී, අපට බාධාවක්ව තිබුණු උතුරේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම, රජයක් හැටියට අතිගරු ජනාධිපතිතුමා ලබපු විශාල ජයග්‍රහණයක්. එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට අපි පරාජයක් ලැබුවා. අපි ඒක පිළිගන්නවා. හැබැයි, රජයක් හැටියට උතුරේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න මැතිවරණයක් පවත්වලා උතුරේ පාලනය උතුරේ ජනතා නියෝජිතයින් අතට පත් කරන්නට ලැබීම අතිගරු ජනාධිපතිතුමාත් රජයක් හැටියට අපත් ලබපු විශාල ජයග්‍රහණයක්. පක්ෂ හැටියට ලැබූ පරාජය වෙනම කාරණයක්. පක්ෂ හැටියට ලැබූ පරාජය ජයග්‍රහණයක් කර ගැනීම සඳහා ඒ ඒ දේශපාලන පක්ෂ මේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ තමන්ගේ ක්‍රමවේදයන් සකසා ගත යුතුයි. විශේෂයෙන්ම වයඹ හා මධ්‍යම පළාත්වලත් මේ මැතිවරණ ප්‍රතිඵලය ඉතාමත් හොඳ සාධක පෙන්නුම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජාතිවාදී පදනම මත දේශපාලනයේ යෙදුණු සියලු දෙනා මධ්‍යම සහ වයඹින් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මම සතුටු වෙනවා. මහජන පක්ෂයේ සහ ලංකා සමසමාජ පක්ෂයේ මතවාදයන් ඉදිරිපත් කරපු නියෝජිතයින් සියලු දෙනා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බස්නාහිරත් එහෙම වෙයිද?

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මධ්‍යම පළාතේ ජයග්‍රහණය කරලා තිබෙනවා. මේක රට තුළ කථා වෙන කථිකාවතක් නොවෙයි. මහජන පක්ෂයේත්, ලංකා සමසමාජ පක්ෂයේත් මහජන නියෝජිතයෝ හැටියට මේ රටේ ජාතික සමගිය වෙනුවෙන් කථා කරපු දේශපාලන පක්ෂවල නියෝජිතයින්ව වයඹ මැතිවරණයේදී ජනතාව පත් කරලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, අනාගතයේ අපට මේ රට පිළිබඳව හොඳ දැක්මක් මේ රටේ ජනතාව වයඹ හා මධ්‍යම පළාත්වලින් අපට පෙන්නුම් කරලා තිබෙනවා. ඒන නිසා ගරු සභාපතිතුමනි, මේ උතුරේ, වයඹ සහ මධ්‍යම ඡන්ද ප්‍රතිඵලයත්, ඒ වාගේම උතුරේ ඇති වුණු තත්ත්වයන් සියල්ලම මේ රටේ අනාගත දරුවන් වෙනුවෙන් ලැබූ ජයග්‍රහණයක් ලෙස මම දකින්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, උතුරේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පිළිබඳව අපි සියලු දෙනා සතුටු වෙනවා වාගේම ඊයේ ආරම්භ කරන ලද වැඩ පිළිවෙළ ඉදිරියට ශක්තිමත්ව ගෙන යෑම සඳහා අපි සියලු දෙනාට ශක්තිය, ධෛර්ය වාසනාව ලැබේවා. අතිගරු ජනාධිපතිතුමන් ඒ ගොඩ නැගූ මිත්‍රත්වයේ, දැත තවදුරටත් ශක්තිමත්ව, ඒ උතුරේ ජනතාවත් සමග බැඳගෙන ඉදිරියට ගිහිල්ලා අපේ ශ්‍රී ලාංකීය ජාතිය ගොඩ නගන්නට හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

# පොදු කටයුතු
PUBLIC AFFAIRS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු විෂයය යටතේ මීළඟට තිබෙන්නේ බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ අවස්ථාවයි. එම ප්‍රඥප්ති කෙටුම්පත 2013.06.18 වන දින මෙම සභාවේ පළමුවර කියැවීම සිදු කර ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනු ලැබුවා. ඊට අනුකූලව 2013.07.23 වන දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරනු ලැබ එම කාරක සභා වාර්තාව 2013.08.19 වන දින සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ තීරණය වන්නේ එම ප්‍රඥප්ති කෙටුම්පත සංශෝධන රහිතව දෙවන වර කියැවීම සඳහා යොමු කිරීම සුදුසු බවයි. තවදුරටත් සංශෝධන ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ගරු මන්ත්‍රීවරුන්ට පූර්ණ කාරක සභා අවස්ථාවේදී අවකාශ ලැබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා. ඒ අනුව ගරු අමාත්‍යතුමාට අවස්ථාව ප්‍රඥප්තිය දෙවන වර කියැවීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට.

# පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම
PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY (AMENDMENT) STATUTE: SECOND READING

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, *"2013 අංක ........... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය"* දෙවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ප්‍රඥප්ති කාරක සභාවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් ඉන්නවා. ඒ මන්ත්‍රීවරු කිසි කෙනෙකු කිසිදු සංශෝධනයක් ඉදිරිපත් කළේ නැහැ. ඒකමතිකව සම්මත කරලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අද දවසේත් විපක්ෂයෙන් මතය විමසා මෙම ප්‍රඥප්ති කෙටුම්පත සම්මත කිරීමට කටයුතු කරන ලෙසට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තිය දෙවන වර කියැවීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට දැන් මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා ඇත.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself in to a Committee of the whole Council.*

# පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවෙන් ප්‍රඥප්ති කෙටුම්පතට සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවන බැවින්ද, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සංශෝධන ඉදිරිපත්ව නොමැති බැවින්ද ගරු අමාත්‍යතුමන් විසින් සභාගත කරන ලද 2013 අංක .... දරන පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තියට එකඟතාවය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වෙනවා ඇත.

***ඊට අනුකූලව පූ.භා. 11.19 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 11.19* a.m. *the Provincial Council resolved itself in to committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය දෙවන වර කියැවීම බෙදීමකින් තොරව ඒකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ලෙස ප්රකාශ කර සිටිනවා.

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම
PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY (AMENDMENT) STATUTE: THIRD READING

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, *"2013 අංක ........... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය"* තෙවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රවාහන කටයුතු අමාත්‍යතුමා ලෙස අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා මාධ්‍යවේදීන්ට නිදහස් ගමන් බලපත්‍රයක් දීලා තිබෙනවා. අපේ පළාත් සභාවට වුණු අගෞරවයක්. මාධ්‍යවේදීන්ට ඒ නිදහස් වාර ගමන් බලපත්‍රය දුන්නාට බස් රථ හිමියන් ඒවා ගණන් ගන්නේ නැහැ. ඒක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. කෙලින්ම විසි කරන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ආනන්ද විජේසූරිය කියන අපේ මව්බිම පත්තරේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා ඔබතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේක අපේ පළාත් සභාවට අගෞරවයක්. ඒ තුළ මේ බලපත්‍රය පිළිගන්නේ නැතුව ටිකට් එකක් අරගෙන යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ගරු සංවිධායකතුමා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නම් මට ඉඩ දෙන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේක පළාත් සභාවට වුණු දෙයක්. මමත් මන්ත්‍රීවරයෙක්. එතුමා මගේ අමාත්‍යවරයෙක්. පක්ෂ භේදයක් නැහැ. මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න. එහෙම බලපත්‍ර දීලා තිබෙනවා නම් ඒවා නීත්‍යානුකූල කරලා ජනතා දැනුවත් කරලා දෙන විධියක් ඇති කරන්න. නැත්නම් මේක ඇත්තටම මාධ්‍යවේදීන්ට කරන අපහාසයක්. බස්නාහිර පළාත් සභාව වශයෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පුදුම ආදරයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔව් අපි ආදරෙයි තමයි. ඔබතුමා භය වෙන්න එපා. මාධ්‍යවේදීන් තමයි අපිව රැක ගන්න ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම ප්‍රශ්නය සම්බන්ධව විෂයය භාර අමාත්‍යතුමා සමග සාකච්ඡා කරනවා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

# දැනට පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම
CHANGING THE ELECTION SYSTEM EXISTING CURRENTLY

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, *"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."*

ඒ වාගේම මම මේකේ පුංචි සංශෝධනයක් කරනවා. මේ කොට්ඨාශ ක්‍රමය කියන එකෙන් පැහැදිලිවම අදහස් කළේ, ජනගහන අනුපාතය අනුව බෙදන එකයි. ඒ අනුව සංශෝධනය වන්නේ, *"ජනගහන අනුපාතය අනුව එකී කොට්ඨාශ සංශෝධනය කළ යුතුයි"* කියලා එම සංශෝධනය ඉදිරිපත් කරමින් යෝජනාව සංශෝධිතාකාරයෙන් සභාවට ඉදිරිපත් කරනවා.

***සංශෝධිතාකාරයෙන් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[පූ.භා. 11.26]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි දීර්ඝ කාලයක ඉඳලා - 1991 ප්‍රාදේශීය සභා මැතිවරණය ජයග්‍රහණය කරලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙලා අද බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙලා ඉන්නවා. අපි මේ ඡන්දය ඉල්ලන්න පටන් ගත් දා ඉඳලා මේ අනුපාත ක්‍රමය යටතේ, මේ මනාප ක්‍රමය යටතේ තමයි අපි මේ ඡන්දවලට ඉදිරිපත් වුණේ. නමුත් අපි දැකපු දෙයක් තිබුණා. මේ මනාප ක්‍රමය තුළ ගොඩක් වෙලාවට ප්‍රතිපත්තිය, කණ්ඩායම් හැඟීම් මේ සියල්ල අද අහෝසි වෙලා තිබෙනවා. මේකත් එක්ක තමන්ගේම පක්ෂයේ අය අතර අද විශාල ගැටුම් ඇති වන ක්‍රමයක් මේ මනාප ක්‍රමය තුළ ඇති වෙනවා. මෙය ගෙනාපු එක්සත් ජාතික පක්ෂය පවා මම හිතනවා මේ කාරණය ගොඩක් වෙලාවට පිළිගන්නවා. මේ මනාප ක්‍රමය තුළ ලොකු ගැටුම්කාරී තත්ත්වයක් තම තමන්ගේම පක්ෂවල ඇති වෙනවා කියලා. එක්සත් ජාතික පක්ෂය තුළ අද ඒක හොඳින්ම ඔප්පු වෙලා තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරන්නේ මේ කොට්ඨාශ ක්‍රමයට, මම මෙතැනදී අදහස් කරන්නේ ප්‍රාදේශීය සභා. අතිගරු ජනාධිපතිතුමාට අපේ ගෞරවය, ස්තූතිය පුද කරනවා. මේ වනකොට ප්‍රාදේශීය සභා මැතිවරණය කොට්ඨාශ ක්‍රමයට සීමා මායිම් වෙන් කරලා, ගැසට් කරලා එළැඹෙන ප්‍රාදේශීය සභා මැතිවරණය කොට්ඨාශ ක්‍රමයට තියන්න අද තීන්දු කරලා තිබෙනවා. ඒ තීන්දුවත් එක්ක අද අපි දකිනවා, ඉදිරියේදී ගමට මන්ත්‍රීවරයෙක් තේරෙනවා. ජනතාවට වග කියන්න කෙනෙක් ඒ ගමෙන් පත් වෙනවා. ඉතින් මේකත් එක්කම ගමේ අවංකම කෙනා, අද ජනතාවට වැඩ කරන කෙනා තේරෙන තැනට එනවා. ඒත් එක්කම මම ඉල්ලා සිටින්නේ, මේ පළාත් සභා මැතිවරණ ක්‍රමයත්, පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයත් ආසන මට්ටමටත්, ජන අනුපාතය අනුව පළාත් සභා මැතිරවණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් හෝ ග්‍රාම සේවා කොට්ඨාශ පදනමක් ලෙස ගෙන ඒ ග්‍රාම සේවා කොට්ඨාශවල එකතුවකින් කොට්ඨාශ ක්‍රමයක් හදලා අන්න ඒ ක්‍රමයට පළාත් සභා මැතිවරණයත් ගෙන එන්නය කියලයි.

මේකට හේතුව ගරු සභාපතිතුමනි, අපි දැක්කා ගොඩක් වෙලාවට අනුපාත ක්‍රමයත් එක්ක, මනාප ක්‍රමයත් එක්ක පැහැදිලිවම වැරදි පුද්ගලයොත් මේ තැන්වලට එනවා. මට මතකයි අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වන කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මේ පළාත් සභාවේ කථා කරනකොට හොඳ පැහැදිලි කිරීමක් කළා. මට මතකයි එදා එතුමාගේ කථාවේදී කිව්වා, මම හිතන්නේ ඒ කාලේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ඉන්නකොට බාර් පර්මිට් දුන්නාය කියලා, පළාත් සභා මන්ත්‍රීවරුන්ට. තමන්ට වැඩ කරපු කෙනෙකුට හෝ කාට හරි දෙන්න දුන්නාම ප්‍රතිපත්තියක් හැටියට ගත්තු නැති අය, ප්‍රතිපත්ති ගරුකව හිටපු අය ඊළඟ

ඡන්දයේදී පැරදුණා කියන එක එතුමා පැහැදිලි කළා. එතුමා ඒක විග්‍රහ කළා. ඉතින් මෙන්න මේ වාගේ තත්ත්වයන් අද උදා වෙනවා. අපි ගොඩක් වෙලාවට මැතිවරණ ගත්තාම මේ කාලය තුළ පැහැදිලිවම අපි දැකපු දෙයක් තමයි වැඩිපුර සල්ලි වියදම් කරන, වැඩිපුර සාරි ටික බෙදලා දෙන, වැඩිපුර අරක්කු ටික බොන්න දෙන කෙනා තමයි අද ඉස්සරහාට එන්නේ. කලාතුරකින් තමයි අවංක කෙනෙක් මෙතැනට එන්නේ. මේක තුළ අවංකව වැඩ කරන කෙනාට ලොකු අසාධාරණයක් වෙනවා. ඒ නිසා තමයි මේ යෝජනාව මේ විධියට ගෙන එන්න හේතු වුණේ.

එදා අපට මතකයි. අපි පුංචි කාලේ පානදුරේ මන්ත්‍රීතුමා කියලා කිව්වේ. කළුතර දිස්ත්‍රික්කය ගත්තාම එද තිබුණේ මතුගම මන්ත්‍රීතුමා කියලා. එදා කිව්වේ හොරණ මන්ත්‍රී කියලා. අද ඒ තත්ත්වය නැති වෙලා. එදා අපට මතකයි. අපි පුංචි කාලේ අහලා තිබෙනවා, රත්නසිරි වික්‍රමනායක මැතිතුමා හොරණ ප්‍රදේශයෙන් ස්වාධීනව ඉල්ලුවාම ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම තිබුණා. ඒ එන්න පුළුවන් වුණේ වෙන හේතුවක් නිසා නොවෙයි ගරු සභාපතිතුමනි. එදා පක්ෂයට, මේ කොට්ඨාශ ක්‍රමයට ආවාම ඉපදුණු දවසේ ඉඳලාම ගමේ ඉන්න පුද්ගලයා දන්නවා මෙයා ඉන්නේ කොහොමද කියලා. ඒ නිසා ගමේ ජනතාව තීන්දුවක් ගන්නවා මෙන්න මෙයයි හොඳ මනුස්සයා කියලා. එදාට පක්ෂ, පාට භේද බලන්නේ නැහැ. ඒ නිසා ගමේ නියෝජිතයාට හැම වෙලාවේම සිද්ධ වෙනවා වැරදි වැඩ නොකර අවංකව සේවය කරන්න. එහෙම නැති වුණොත් එහෙම තමන් පරාජය වෙනවා කියන එක තමන් තේරුම් ගන්නවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මෙන්න මේ කරුණුත් එක්ක එකතු වුණාම මේ කොට්ඨාශ ක්‍රමයට ගෙන එන්න කියලා.

ඒ වාගේම මේ තුළ අද ගොඩක් දුරට අපේ මන්ත්‍රීවරු ලොකු චෝදනාවකට ලක් වෙලා තිබෙනවා. අභූත චෝදනාවලට ලක් වෙලා තිබෙනවා. වෙලාවකට අපට සමහර මන්ත්‍රීවරු ගැන කනගාටු හිතෙනවා. මොකද, අවංකව වැඩ කරපු අය පරදිනකොට, මේ වාගේ වංචනික අය ඉස්සරහාට එනකොට - ප්‍රාදේශීය සභා මැතිවරණයක් ගත්තාම අපි පැහැදිලිව දැකලා තිබෙනවා, ඒ මැතිවරණවලදී ප්‍රදේශයේ බූරු ගස්සන, කසිප්පු පෙරන මේ වාගේ අයත් තේරිලා එනවා. මොකද, ඒකට හේතුව වෙන දෙයක් නොවෙයි. මේ මනාප ක්‍රමය තුළ ගමේ අය ඡන්දය දුන්නේ නැති වුණත් මනාප ක්‍රමය තුළ දිස්ත්‍රික්කයෙන් මනාප ගෙන එහෙම අය තේරිලා එනවා. අන්න ඒ නිසයි මම වැඩි හරියක්ම තීන්දු කළේ, මේ යෝජනාව ඉදිරිපත් කරන්න ඕනෑය කියලා. ඒ වාගේම මේ තුළ පක්ෂවල සමගිය ආරක්ෂා වෙනවා. අද අපි පැහැදිලිවම දන්නවා. ගොඩක් පක්ෂවල සමගියක් නැහැ. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමගිය තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය නිසා. සමහර පක්ෂවල අද ඒක නැති වෙලා තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒකද අගමැතිතුමා පෙළපාලි යන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

උදාහරණයක් විධියට ගත්තාම එක්සත් ජාතික පක්ෂයේ අද ඒ සමගිය නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අගමැතිතුමා නුවර පෙළපාලි යනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම පෙළපාලි යන්නේ නැහැ. කොහේවත් පෙළපාලි යන්නේ නැහැ. පෙළපාලි නොවෙයි. පිළිගැනීම්වලට යන්නේ. තමුන්නාන්සේලා ලැජ්ජ නැතුව පෙළපාලි ගැන කථා කරනවා. තමුන්නාන්සේලාට රෙද්දක් ඇඳගෙන පෙළපාලි ගැන කථා කරන්න බැහැ. පෙළපාලි ගැන කථා කරන්නේ කොහොමද? තමුන්නාන්සේලාගේම පක්ෂයේ අය පොළු මුගුරු අරගෙන -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ, එහෙන් ආපු එක්කෙනා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පක්ෂවල වෙඩි තියා ගන්නවා. අපේ පක්ෂවල එහෙම නැහැ. අපි විරුද්ධ පක්ෂයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා. ඒ අවස්ථාවේදී කථා කරන්න. බාධා කිරීම් කරන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

බයිලා නේ කියන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් බයිලා කියන්න. එතකොට හරි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද දිවයින පත්තරේ මොකක්ද තියෙන්නේ? *"කුලප්පු වූ අලි යළි රිමාන්ඩ්."* දිවයින පත්තරේ තියෙන්නේ. තමුන්නාන්සේලාම අද මෙතැන මෙහෙම කථා කළාට අපට ඇහුනා කට්ටියත් එක්ක එහා පැත්තේ කථා කරන දේවල්. තමුන්නාන්සේලා අපේ කණ්ඩායමේ එහෙම දේවල් දැකලා තියෙනවාද?

[සභාවේ ඝෝෂා]

අපි විරුද්ධ පක්ෂය කාලේ එදා අතිගරු ජනාධිපතිතුමා කොළඹ ඉඳලා කතරගමට පයින් ගියා. කට්ටිය ඔක්කෝම එකට එකතු වෙලා. මෙහෙම ගියේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලොක්කා භය වෙලා

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද ලොක්කා භය නොවෙයි. ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා කෝ? තමුන්නාන්සේලා ගහලා. වෙඩි තියලා. තමුන්නාන්සේලාට ආණ්ඩුවක් ආව නම් කොහොම හිටියිද? තමුන්නාන්සෙලාගේ ආණ්ඩුවක් ආවා නම් ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. අද ඒ නිසා තමයි තමුන්නාසේලාව දිගින් දිගටම පරාජය කරන්නේ. අද ඒ නිසා තමයි තමුන්නාන්සේලාට මේ ජනතා නියෝජිතයන් නැති වෙන්නේ. තමුන්නාන්සේලා බලන්න, මේ බස්නාහිර පළාත් සභාවේ එළැඹෙන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ඇපත් නැති වෙනවා. අද ඒ තත්ත්වයට පත් වෙලා. මම තමුන්නාන්සේලා ආරාධනා කරනවා. එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අනවශ්‍ය දේවල් කථා කරන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ජනතාවට වැඩ කරන්න බැහැ. එන්න අපිත් එක්ක. අපිත් එක්ක එකතු වෙලා ජනතාවට වැඩ කරමු. (බාධා කිරීමක්) ඒක ඔප්පු වෙලා ඉවරයි. හැබැයි මෙහේ ආවට දෙන්න මහ ඇමැතිකම් අරවා මේවා නම් නැහැ. නිකම් මන්ත්‍රීවරයෙක් වෙන්න ඕනෑ නම් එන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, පැහැදිලිවම -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය විවාදවලට යන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මේකත් එක්කම අපට මේක ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වුණොත්, මේ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තු ආසන මට්ටමට නැවත ගෙන එන්න පුළුවන් වුණොත් ගරු සභාපතිතුමනි, ජනතාව වග කියන මන්ත්‍රීවරයෙක් පත් කර ගන්න පුළුවන්කම තිබෙනවා. අවංකව සේවය කරන මන්ත්‍රීවරයෙක්ව පත් කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඉතින් ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, ජනතාවට වග කියන අවංක මන්ත්‍රීවරයෙක් පත් කර ගන්න ආසන මට්ටමට මේ මැතිවරණ ක්‍රමය ගෙන

එන්න කියලා. එහෙම ගෙනාවොත් එහෙම අපට පුළුවන්කම තිබෙනවා, ජනතාව බලාපොරොත්තු වන ජනතා නියෝජිතයන් මෙතැනට පත් කරන්න. එහෙම නැති වුණොත් එහෙම, තව ටිකක් කල් මේ විධියට ගියොත් එහෙම ගරු සභාපතිතුමනි, අවංක අය මේ දේශපාලනයෙන් ඉවත් වෙලා යනවා. දේශපාලනයෙන් ඉවත් වෙලා ගිහිල්ලා මේක හොරුන්ටම ගිය තැනක් වෙනවා. ඒ නිසා මෙන්න මේ කොට්ඨාශ ක්‍රමයට, ආසන මට්ටමට මේ මැතිවරණ ක්‍රමය ගෙන එන්න කියන ඉල්ලීම තමයි, යෝජනාව තමයි මම ඉල්ලා සිටින්නේ. මේකත් එක්ක අපි හැමදාම බලාපොරොත්තු වුණු - අපි හැමදාම හිටියේ, මේ මනාප ක්‍රමයත් එක්ක. අපටත් පුළුවන්කම තියෙනවා ඉදිරියේදී, පක්ෂයේ සමගියෙන්, ජනතාවට සේවය කරපු හොඳ අවංක මිනිස්සු පත් කරගෙන මේ පළාත් සභාව තුළ වේවා, පාර්ලිමේන්තුව වේවා ජනතාව බලාපොරොත්තු වන ඉලක්කයකට මෙය ගෙන යන්න. ඒ නිසා තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.37]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මේ කාලීන යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, අපි දන්නවා එතුමා පොළවේ පය ගහලා ඉන්න මන්ත්‍රීවරයෙක්. ඒ නිසා සැබෑ ජනමතය කොතැනද තිබෙන්නේ කියන එක පිළිබඳවත් හැඟීමෙන් යුතුව තමයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි, අපි ටිකක් අතීතයට යන්න ඕනෑ. මොකද, අපේ රටේ පාර්ලිමේන්තු මැතිවරණය - විශේෂයෙන්ම මේ පළාත් සභා ආරම්භයේදී ඉඳලා තමයි මනාප, එහෙම නැත්නම් අනුපාතික ක්‍රමයට මන්ත්‍රීවරු පත් කිරීමේ ක්‍රමය ආරම්භ වුණේ. නමුත් එතුමා කිව්වා වාගේ කොට්ඨාශ ක්‍රමයට ඡන්ද පවත්වපු අවස්ථා අපි දැකලා තිබෙනවා. ගම් මට්ටමෙන් ගම් සභාවල. සුළු නගර සභාවල, නගර සභාවල. ඒ වාගේම පාර්ලිමේන්තුවේ. විශේෂයෙන්ම සුදුස්සෝ තේරී පත් වුණා. මොකද, දේශපාලන පක්ෂ භේදයකින් තොරව ජනතාව තෝරා ගත්තා, පක්ෂය කෙසේ වෙතත් මේ ප්‍රදේශයට සේවය කරන්න උවමනා පුද්ගලයෙක්ව. ඒ නිසා සමහර අවස්ථාවල ප්‍රධාන දේශපාලන ධාරාවලින් ඉදිරිපත් වුණු අපේක්ෂකයෝ පරද්දලා ස්වාධීනව ඉදිරිපත් වන අපේක්ෂකයෝ දිනලා තිබෙනවා. ඒක තමයි මම හිතන්නේ සැබෑ ජනමතය, ගම් පළාත නියෝජනය වුණා කියලා. හැබැයි මේ අනුපාත ක්‍රමයට මන්ත්‍රීවරු පත් කරන්න වුණාට පස්සේ අපි මුහුණ දීපු ප්‍රධානම අර්බුදය තමයි කොට්ඨාශයක් නියෝජනය කරන්න නියම වශයෙන් දේශපාලන පක්ෂයකින් හරි හමන් විධියට මන්ත්‍රීවරයෙක් පත් නොවීම. සමහර අවස්ථාවල එතුමා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ වුණත් අද තත්ත්වය දිහා බැලුවොත් එහෙම සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තේරී පත් වුණාම මේ අනුපාත ක්‍රමයේදී තමන් ඇත්ත වශයෙන්ම නියෝජනය කරපු කොට්ඨාශය නොවෙයි, වෙනත් කොට්ඨාශයක සංවිධායකකම තමයි මම හිතන්නේ භාර දීලා තිබෙන්නේ. එහෙම අවස්ථා අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ වුණත් අවශ්‍ය නම් කියන්නත් පුළුවන්. ඒක නිසා අර තමන්ගේ ගම් ප්‍රදේශය නියෝජනය කරලා දේශපාලන වශයෙන් තමන්ගේ නියෝජිතයා පත් කරලා ඇරියාට පස්සේ ඒ ප්‍රදේශයේ ජනතාවට නියෝජිතයෙක් නැතුව යනවා. මෙතැනදී එතුමා කියපු එක කාරණාවක් තමයි බලය තිබෙන පුද්ගලයා, සල්ලි තිබෙන පුද්ගලයා පුළුවන් තරම් උඩට ඉස්මතු වෙන්න බලනවා. අපි දැක්කා, පසුගිය වයඹ පළාත් සභා මැතිවරණයේදී, මධ්‍යම පළාත් සභා මැතිවරණයේදී මොන විධියේ මුදල් නාස්තියක්, මම හිතන්නේ මේ රටේ දේශපාලනයේ ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ ආකාරයට, අපි දැකපු නැති විධියට වරප්‍රසාද, වරදාන, මුදල් මේ සියලු දේවල් මහජන ඡන්දය වෙනුවෙන් පූජා කෙරුවා. වියදම් කෙරුවා. එහෙම කරලත් සමහර අයට තමන් බලාපොරොත්තු වුණු තැනට එන්න බැරුව ගියා. හැබැයි ජනතාව දැන් මේකට පුරුදු පුහුණු වෙලා ඉන්නවා. සමහර වෙලාවට ඒ තිබෙන සියලුම වරප්‍රසාදයන් අරගෙන තමන් කැමැති අපේක්ෂකයාට ඡන්දය දෙනවා. ඒ අපේක්ෂකයා තමන්ගේ කොට්ඨාශයේ නොවෙයි. එහෙම වුණාම වෙන්නේ කොට්ඨාශයට නියෝජනයක් නැතුව යනවා. කොට්ඨාශයට නියෝජනයක් නැතුව ගියාම, හරි හමන් විධියට හතර මායිම දන්නේ නැති, කොහේ හරි ඉඳලා උඩින් පාත් වුණු කෙනෙක් කියයිද, *මම ආවේ සල්ලිවලින්. මම ආවේ ඉහළින්. මට බලයක් තිබුණු නිසාය* කියලා. ඒ නිසා මහජන බලය ගැන සලකන්නේ නැතුව තමන්ගේ කොට්ඨාශයට වැඩක් කරන්න අවශ්‍යතාවය ඒ තේරුණු පුද්ගලයාට ඕනෑ වෙන්නේ නැහැ.

ඒ වාගේම එතුමා කථා කරද්දී විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය ගැන කථා කළා. එතුමාට පොඩ්ඩක් මතක්

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා]

කරලා දෙන්න ඕනෑ. මම එතුමාට බාධා කරද්දිත් කිව්වා තමයි, මේ පහුවුණු මැතිවරණ දෙකම එහෙම නැත්නම් තුනම, උතුරු මැතිවරණය ගත්තත් එකම දේශපාලන පක්ෂවල අය තමයි වැඩි හරියක් පොර කුකුල්ලෝ වාගේ පොර කෑවේ. අඩන්තේට්ටම් කර ගත්තේ. දේපල අලාභ හානි කර ගත්තේ. එහෙමත් නැත්නම් සණ්ඩු සරුවල් කර ගත්තේ. ඒකට හොඳම උදාහරණය තමයි කුරුණෑගල එහෙම නැත්නම් මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵල දිහා බැලුවාම අදටත් ඡන්දය ඉවර වෙලත් කුරුණෑගල ගත්තොත් එහෙම පළමුවැනියාට ආපු අයයි, දෙවැනියාට ආපු අයය ගහගන්නවා. නුවර ගත්තොත් දෙවැනියාට මහ ඇමැතිකම දුන්නා කියලා පළමුවැනියාට ආපු කෙනා පෙළපාලි යනවා. මේක බොරුවක් නොවෙයි. මේක තමයි ඇත්ත කතන්දරේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට පමණක් ඇඟිල්ල දික් කරන්න එපා. අපි කියනවා, මේක අපේ පක්ෂය ඇතුළේත් මේක තිබෙනවා. මම නැහැයි කියලා කියන්නේ නැහැ. සමහර වෙලාවට ජනතා විමුක්ති පෙරමුණේ මේ ක්‍රමය නැති වෙන්න පුළුවන්. නමුත් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක හැටියට එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සන්ධානය ඇතුළේත් මේ ක්‍රමය තිබෙනවා. ඒ නිසා සැබෑ ජනමතය නියෝජනය වෙන්න, ඒ ප්‍රදේශයේ ජනතාවට සේවය කරන්න ඕනෑ සැබෑ සුදුස්සා, තෝරා ගන්න ඕනෑ ඒ කොට්ඨාශයෙන්.

දැන් පළාත් සභා ඡන්දයක් තිබුණොත් එහෙම අපි කියන්නේ, පාර්ලිමේන්තුව නිර්ණය කරලා තිබෙන කොට්ඨාශ අනුව තියන්න කියලා. අනිවාර්යයෙන්ම මැතිවරණ කොට්ඨාශ නිර්ණය කිරීමක් කරන්න සිද්ධ වෙනවා. පාර්ලිමේන්තුව වාගේ නොවෙයි, පළාත් සභා මැතිවරණයකදී අපේක්ෂකයෝ සංඛ්‍යාව වැඩි වන නිසා. උදාහරණයක් හැටියට සමහර මැතිවරණ කොට්ඨාශ දෙකකට එහෙම නැත්නම් තුනකට කැඩෙන්න පුළුවන්. එතකොට පළාත් සභා මන්ත්‍රීවරයා ඒ කොට්ඨාශයට සීමා වුණාම මම හිතන්නේ, ඉතා කුඩා කොටසක් අහු වෙන්නේ. අද සුළු නගර සභා, නගර සභා, ගම් සභාවල නියෝජිතයෝ තෝරන්න පාර්ලිමේන්තුවේ පනත ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා. මම හිතන්නේ ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ ඉඳලා තමයි මේ ක්‍රමයට එන්න තිබුණේ. පාර්ලිමේන්තුවෙන් පටන් අරගෙන, පළාත් සභාවෙන් සහ ඊළඟට පළාත් පාලන ආයතනවලට දුන්නා නම් තමයි හොඳ. නමුත් අද ආරම්භයක් විධියට පළාත් පාලන මැතිවරණය කොට්ඨාශ ක්‍රමයට පවත්වන්න යනවා. ඒක ඉතා හොඳයි. අපි දන්නවා, අපට මේක කරන්න කාලයක් නැහැ. තව මාස දෙක තුනකින් මේ පළාත් සභාවේ ආයුෂ කාලය ඉවර වෙනවා. ඊළඟට එන්නේ පාර්ලිමේන්තු මැතිවරණය. පාර්ලිමේන්තු මැතිවරණය එනකොට කොට්ඨාශ ක්‍රමය නියෝජනය කරන විධියට - ඇත්ත වශයෙන්ම ඉස්සෙල්ලාම මේ වැඩ සටහන ක්‍රියාත්මක කළොත් මම හිතන්නේ, ඒක ඉතාම ප්‍රතිඵල දායකයි. හැබැයි, එතැනදී සිද්ධ වන යම්කිසි අසාධාරණයක් තිබෙනවා. ආසන මට්ටමින් ඡන්දය පවත්වන කොට ජනමතය සැබෑ ලෙස නියෝජනය වන්නේ නැහැයි කියන කාරණාව තමයි, දිස්ත්‍රික්කයක් විධියට ගත්තාම සැබෑ ජනමතය නියෝජනය වන්නේ නැහැයි කියන කාරණාව නිසයි මේ අනුපාත ක්‍රමය මම හිතන්නේ ඒ කාලයේ සකස් කරන්න ඇත්තේ.

දැන් උදාහරණයක් ගත්තොත් එහෙම ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල මැතිවරණ කොට්ඨාශයේ දේශපාලන පක්ෂයක් ඉතා ඉහළ ප්‍රතිශතයකින් දිනන කොට තවත් මැතිවරණ කොට්ඨාශයක් ඊට අඩුවෙන් දිනන්න පුළුවන්. හැබැයි දිස්ත්‍රික්කයක් විධියට මේක එකතු වෙලා එන කොට ප්‍රතිඵලය වෙනස්. නමුත්, මෙතැනදී යම් යම් නියෝජිතයන් තෝරන කොට මේ කොට්ඨාශවලට තේරෙන නියෝජිතයෝ වාගේම කොට්ඨාශවලට වෙන් වෙන් වශයෙන් නියෝජිතයෙක් තේරෙනවා වාගේම, ඒ ප්‍රතිශතය අනුවත් මන්ත්‍රීවරු තෝරා ගන්නා ක්‍රමයක් එනවා නම් මම හිතන්නේ, එතකොට සැබෑ විධියටම ජනමතය නියෝජනය වෙනවයි කියන අදහස මගේ තියෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් ගම්පහ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 13 යි. තමුන්නාන්සේ දන්නා විධියට, මේ 13 ට අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 18 ක් හෝ 19 ක් ඉන්නවා. ඒ නිසා කොට්ඨාශ 13 ට මන්ත්‍රීවරු 13 දෙනෙක් ඍජුවම තෝරන කොට තව හය දෙනෙක්, එහෙමත් නැත්නම් හත් දෙනෙක් ඒ අනුපාත ක්‍රමය අනුව පත් වෙනවා. එහිදී ජාතීන් වශයෙන්, ආගම් වශයෙන් එහෙමත් නැත්නම් වෙනත් දේශපාලන පක්ෂ නියෝජනය වන විධියට සුළු දේශපාලන පක්ෂවලට පාර්ලිමේන්තුවේ බලය ලබා දෙන්න පුළුවන් විධියට, පළාත් සභාවේ බලය ලබා දෙන්න පුළුවන් වෙන විධියට මේක සකස් කරනවා නම් හොඳයි. මම හිතන්නේ මේ යෝජනාව කාලීන යෝජනාවක්. මේ සභාව විධියට අපට කරන්න පුළුවන් ඉල්ලීමක් විතරයි. මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ, පාර්ලිමේන්තුව. දිනේෂ් ගුණවර්ධන

ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ සඳහා පාර්ලිමේන්තුවේ පළාත් පාලන ආයතනවලට මැතිවරණ ක්‍රමය සැදීම පිළිබඳව කමිටුවක් පත් කරලා තිබුණා. ඒ කමිටුවේ නිර්දේශ දීලා තිබුණා. ඒ නිසා ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන්න. නිර්දේශ ක්‍රියාත්මක කරන්න තියෙන ආසන්නම මැතිවරණය තමයි පළාත් සභා මැතිවරණය. නමුත් ඒකෙදි මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා එළැඹෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී මේ කොට්ඨාශ ක්‍රමය නැවත වතාවක් ලංකාවේ ස්ථාපිත කරලා ඉවර වෙලා සැබෑ ජනමතය නියෝජනය වන ආකාරයට චුවමනා කරන අලුත් මන්ත්‍රීවරු 225 ක් තෝරලා - මැතිවරණ කොට්ඨාශ තියෙන්නේ 160 යි. ඒ අනුව ඉතිරි මන්ත්‍රී ධුර එකී කොට්ඨාශයන් ජනතාව නියෝජනය කරන විධියට පත් කරන්න පුළුවන් විධියට සැකසීමෙන් හැම දෙනාටම සාධාරණයක් ඉෂ්ට වෙනවා. ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවට අපේ සහයෝගය පළ කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.43]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, අපේ එල්ලාවල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඉතාම වැදගත් යෝජනාව සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. මම මගේ කථාව ආරම්භ කරන්නේ, වර්ෂ 2005 සාහිත්‍ය සඳහා නෝබෙල් ත්‍යාගය පිළිගනිමින් හැරල්ඩ් ප්‍රින්ටර් නමැති විද්වතා කරපු ප්‍රකාශයකින්. ඔහු මෙන්න මෙහෙම කියනවා.

*"බොහෝ දේශපාලඥයෝ බලයේ රැඳී සිටීමට හෝ එය පවත්වා ගෙන යාමට උනන්දු වනවා මිස යථාර්ථය පිළිබඳ උනන්දු නොවෙති. ඔවුන්ගේ බලය පවත්වා ගෙන යාමට මිනිසුන්ගේ නොසැලකිලිමත් වීම අත්‍යවශ්‍ය වේ".*

මේ විශිෂ්ට විග්‍රහයෙන් හැරල්ඩ් ප්‍රින්ටර් ලෝකයට දෙන පණිවිඩය කුමක්ද? මේ බලය අයුතු ලෙස යොදා ගැනීම දේශපාලනය තුළ ඇති වී තියෙන පරිහානිය ඡන්දදායකයාගේ නොසැලිකිලිමත්කම නිසා සිදුවන බවයි. අපි දන්නවා. මේ වයඹ මැතිවරණය තෙක්ම මේ රටේ පූර්ව නිගමනයක් තිබුණා, වැඩියෙන්ම සල්ලි වියදම් කරන කෙනා තමයි වැඩියෙන්ම මනාප ලබා ගන්නේ කියන යථාර්ථය. හැබැයි, මේ වයඹ මැතිවරණයේදී - මම වයඹ ජනතාවට ස්තුතිවන්ත වෙනවා. ඔවුන් ඉතා නිවැරදි පණිවිඩයක් මේ රටට දුන්නා. මනාපය ලබා දීම තීන්දු වන්නේ, අපේක්ෂකයා වියදම් කරන මුදල් ප්‍රමාණය මත නොව, ඊට වඩා වැදගත් කරුණු කාරණා තියෙනවයි කියලා. බැරි වෙලාවත් වැඩියෙන්ම වියදම් කරපු අපේක්ෂකයා, වැඩියෙන්ම අරක්කු දුන්න අපේක්ෂකයා, වැඩියෙන්ම සාරි බෙදපු අපේක්ෂකයා, වැඩියෙන්ම දුරකථන බෙදපු අපේක්ෂකයා පළමුවැනි තැනට ආවා නම් ගරු සභාපතිතුමනි, අපට ලැබෙන සංඥාව කුමක්ද? මැතිවරණයක් දිනන්න නම් කළ යුත්තේ මුදල් වියදම් කිරීම පමණක් කියන සංඥාවයි. ඒ නිසා මේ කථාව ආරම්භ කරන්නේ, ඒ වයඹ බුද්ධිමත් වැදගත් ඡන්දදායකයන්ට අපේ ප්‍රණාමය පුදකරමින්.

මගේ උගත් මිත්‍රයා ගරු මන්ත්‍රීතුමා, දැනට ක්‍රියාත්මක වීමට යෝජිත ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය පිළිබඳව මහත් ආශ්වාදයකින් යුතුව කථා කළා. අර ගස් නැති රටේ තුත්තිරි ගහත් ගහක් කියලා තියෙන නිසා ඇත්තෙන්ම අපට පොඩි ආශ්වාදයක් තියෙනවා තමයි. හැබැයි, මේ මැතිවරණ ක්‍රමය ඉතා ගැඹුරින් විශ්ලේෂණය කළොත් එහි අඩුපාඩුකම් රාශියක් තියෙන බව මේ වන කොට මා නම් තේරුම් අරගෙන තිබෙනවා. ඉතාම කඩිමුඩියේ මේ පනත සම්මත කරන්න අපට සිදුවීම නිසා එහි බොහෝ අඩුපාඩු සමගම තමයි ඒ පනත සම්මත වී තිබෙන්නේ. ඒ නිසා ඉතාම නුදුරු දිනයක මේ පනතට එකතු කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් යෝජනාවක් ගෙන ඒමට මා බලාපොරොත්තු වන බව මගේ උගත් මිත්‍රයාගේ සතුටට හේතුවන අන්දමින් කියන්න කැමතියි. මේ මැතිවරණ ක්‍රමයට අදාළව මා කරුණු දෙකක් තුනක් පමණක් මේ සභාවට අවධාරණය කරන්න කැමතියි. එහි තිබෙනවා, සභාපතිවරයා අයවැය විවාදයේදී අයවැය වාර්තාව පරාජයට පත් වුවහොත් ඔහු අයින් කරන්න පුළුවන් කියලා. සල්ලිකාර උප සභාපතිවරයෙකුට පුලුවන් ගරු සභාපතිතුමනි, අර මන්ත්‍රීවරු සියලු දෙනාම මිලට ගන්න. මිලට අරගෙන අයවැය ලේඛණය පළමුවැනි වතාවේම පරාජයට පත් කරලා සභාපතිවරයාව අයින් කරලා උප සභාපතිවරයාට සභාපති වෙන්න පුළුවන්. (බාධා කිරීමක්)

මම මේ කියන්නේ, මේ කාරණාව නිසා අද නගර සභා, ප්‍රාදේශීය සභා තුළ විශාල අවිනිශ්චිත භාවයක් තිබෙනවා.

[ ගරු කීර්ති උඩවත්ත]

පක්ෂ රාශියක් එකතු වෙලා බලය කේන්ද්‍ර කරගන්න වුණු සමහර ප්‍රාදේශීය සභාවල සභාපතිවරු නගරාධිපතිවරු ඉන්නේ කොයි මොහොත් තමන් බලයෙන් ඇද දමයිද කියන අදහසින්. ඒ වාගේම මේ ක්‍රමය තුළ අපට කලින් යෝජනා වුණේ, ඉතාම තියුණු සටනක් දී පරාජය වුණු අය තමයි ප්‍රාදේශීය සභාවට, නගර සභාවට ඊළඟට ඇතුළු වන්නේ කියලා. නමුත් ඒ සංශෝධනයට ඒ යෝජනාවට වුණු දෙයක් නැහැ. දැන් අලුතෙන් පත් වෙන මන්ත්‍රීවරු සියලු දෙනාම යෝජනා කරන්නේ ආසන සංවිධායකවරයාගේ නිර්දේශය මත පක්ෂයේ මහ ලේකම්වරයා විසින්.

කවදාවත් මැතිවරණයට සහභාගි නොවුණු පෝස්ටරයක් ගහපු නැති මැතිවරණය වෙනුවෙන් එක දහදිහ බින්දුවක් හෙළපු නැති නිකමම් නිකම් පියර බබෙක් ප්‍රාදේශීය සභාවට යනවා විතරක් නොවෙයි, මේ පනත අනුව ඔහුට සභාපති වෙන්න, නගරාධිපති වෙන්නත් බැරිකමක් නැහැ. ඒ නිසා ඉදිරි කාලයේදී මේ අඩපාඩුව අපි සකස් කරගත යුතුව තිබෙනවා. නමුත්, මේ අඩුපාඩු යටතේ වුණත් සභාපතිතුමනි, මේ තබපු පියවර යෝධ පියවරක්. යෝධ පිම්මක්. මොකද, අපි සමානුපාතික මැතිවරණ ක්‍රමයේ ඉතාම අයහපත් ලක්ෂණ මේ වෙන කොට අවබෝධ කර ගෙන තිබෙනවා. සමානුපාතික මැතිවරණ ක්‍රමය නිසා මගේ උගත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එකම පක්ෂයේ නියෝජිතයන් අතර බරපතළ ගැටුම්කාරී තත්ත්වයන් මතු වෙනවා. එහෙම වෙන්නේ ඉතාම දුර්වල විරුද්ධ පක්ෂයක් තියෙන අවස්ථාවක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැම තිස්සේම එතුමාට උගත් මන්ත්‍රීතුමා කියන්නේ අනෙක් කට්ටිය නුගත් කියන එකද? නැහැ නේ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඔබතුමාට එහෙම එකක් කියන්න බැහැ නේ කවදාවත්. ඔබතුමා නුගත් විධියටම තමයි කථා කරන්නේ. ඉතින් ඒ නිසා ඒ වචන ඔබතුමාට කියන්න බැහැ. ඒ නිසා කරුණාකරල මේක අහගෙන ඉන්න. මෙහෙමයි මන්ත්‍රීතුමා, අපි ටයි කෝට් ඇන්දා නම්, ඒ ඇඳුමට ගැලපෙන විදියට ඉන්න ඕනෑ. ඔබතුමා බල්ලෝ බලන්න යන උත්සවයකට ආවා නම් ඒක ප්‍රශ්නයක් නැහැ. මේ ඇවිල්ලා ඉන්නේ ඉතාම වැදගත් සභාවකට. ඒ නිසා ඔබතුමා අනෙක් වැදගත් මන්ත්‍රීතුමාලා වාගේ හැසිරෙන්න කෝ? අනෙක් අයගෙන් ආදර්ශයක් ගන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම හිතුවේ එතුමා විතරයි ඉන්නේ කියලා

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

නැහැ මෙහෙමයි. ඔබතුමා මේ සභාව තුළ නිකම් විහිළු කාරයෙක් බවට පත් වෙලා තියෙනවා. මට හරි නගාටුයි. ඔබතුමාගේ තාත්තා බොහොම ජොෂ්ඨ දේශපාලනඥයෙක්. ඒ තාත්තාට ගෞරවයක් විධියට හැසිරෙන්න. (බාධා කිරීම) මම කියා ගෙන ආවේ සභාපතිතුමනි, මෙය වැදගත් යෝජනාවක්. මේ වැදගත් යෝජනාව ගැන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් දක්වන ආකල්පය අපට ඉතින් හිතාගන්න හරි අමාරුයි, ඇයි මෙහෙම හැසිරෙන්නේ කියලා. නමුත් ඉතින් ඒකට කරන්න දෙයක් නැහැ. මේ මැතිවරණ ක්‍රමයේ තියෙන අයහපත් ලක්ෂණ තමයි. තාත්තාගේ ඡන්ද ටිකෙන් එහෙම නැත්නම් වෙනත් තමුන්ගේ ධනය, නිලය, බලය පාවිච්චි කරලා නුසුදුසු මිනිස්සු සභාවලට එනවයි කියන එක අර්ථ ගන්වන පුද්ගලයෙක් තමයි මේ මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට නාමල්ටත් එක්කද ඔය කියන්නේ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ඒ නිසා කරුණාකරලා තමන්ට කථා කරන්න බැරි නම් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒවා කියන්නේ නැහැ. ඒවා කියන්න බයයි.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

තමන්ට වැදගත් දෙයක් කථා කරන්න බැරි නම් අඩුගණනේ අහගෙන ඉන්නවත් පුරුදු

වෙන්න. (බාධා කිරීම්) හරි සාමාන්‍යයෙන් භාවිතාවේදී උගත් මන්ත්‍රීවරයෙක් කියලා කියන්නේ නූගත් වුණත් කරන්න දෙයක් නැහැ. ඒක යෙදුමක්. මොකද, උසාවියේ කටයුතු කරන කොට අපි නීතිඥවරුන් අමතන්නේ උගත් නීතිඥවරුන් කියලා. ඉතින් මෙතුමාගේ ඇත්තටම මම දන්නේ නැහැ මොකක් හරි විකෘතියක් තියෙනවා. මනෝ විකෘතියක්. ඡන්දෙට ඉස්සෙල්ලා ඕකට බෙහෙත් කර ගන්න.

ගරු සභාපතිතුමනි, මම කනගාටු වෙනවා මෙතරම් වැදගත් යෝජනාවක් ගැන කථා කරද්දි එතුමා අපට බාධා කිරීම ගැන. මම මේ කියා ගෙන ආවේ එකම පක්ෂයක් ඇතුළේ මේ බරපතළ ගැටලු ඇති වෙන්නේ විරුද්ධ පක්ෂය දුර්වල වීම නිසා කියන එකයි. මොකද, ප්‍රධාන පක්ෂය විරුද්ධ පක්ෂය සමග ඉතාම තියුණු තරගයක් තියෙන අවස්ථාවක ඔවුන් ගැටෙන්නේ, විපක්ෂයේ දේශපාලන කණ්ඩායම් එක්කයි. නමුත් විපක්ෂයෙන් එවැනි ප්‍රබල තර්ජනයක් එල්ල නොවන අවස්ථාවකදී තරගය තිබෙන්නේ, එකම පක්ෂයේ උදවිය අතර. අද මේ රටේ වෙලා තියෙන්නේ ඒකයි. ඒ නිසා අපි ප්‍රාර්ථනා කරනවා එක්සත් ජාතික පක්ෂය-

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ධනසිරි පළාත් සභාවට ආවාම බලා ගන්න පුළුවන්

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු මන්තීතුමනි, ඇත්තෙන්ම තමුන්නාන්සේට ඡන්දය දීලා මේ පළාත් සභවට එවපු ජනතාව ගැන මට හරි කනගාටුවක් ඇති වෙනවා. මේ වාගේ අද බාල, සභාවක හැසිරෙන්න දන්නේ නැති වැදගත් තාත්තා කෙනෙක්ට නින්දා කරන පුත්‍රයකු ගැන අපි කනගාටු වෙනවා. මාධ්‍යයන් මම ඉල්ලා සිටිනවා මේ වාගේ මන්ත්‍රීවරුන්ව සමාජයට හඳුන්වලා දෙන්න කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් ඒක මාධ්‍යයෙන් හඳුන්වන්නට කිව්වාට ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ නමක් කියන්නේ නැහැ නේ? ඔක්කෝම -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

නැහැ. නැහැ. මේ ටයිකෝට් දාපු ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා-

(බාධා කිරීම)

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉතා නිහතමානීව ඉල්ලා සිටිනවා,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ටයිකෝට් දාපු ඔක්කෝම ඒ වාගේද?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මේ වැදගත් යෝජනාව සම්බන්ධයෙන් මගේ වටිනා කාලය මේ මන්ත්‍රීතුමා කරපු බාධා කිරීම් නිසා -

තමුන්නාන්සේ කියන්නේ තමුන්නාන්සේ කියන ඔක්කෝම බහුබූත කථා අහගෙන කට වහ ගෙන ඉන්න කියලද? මගේ ඉල්ලීම ගරු සභාපතිතුමනි, ඔය වාගේ දේවල් ඉඳලා හිටලා අපට සිද්ධ වෙනවා. මට හරි කනගාටුයි. මොකද, මේ සම්බන්ධයෙන් වැදගත් කථාවක් කරන්නයි මම බලාපොරොත්තු වෙන්නේ. මට අඩුතරමින් විනාඩි දෙකක්වත් වැඩිපුර දෙන්න. මේ මගේ කථාව අවසන් කරන්න. මම කියා ගෙන ආවේ-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

බොහොම ස්තුතියි. මම ඉතාම ගෞරවයෙන් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ විනාඩි පහ තුළ මට කථා කරන්න ඉඩ දෙන්න කියලා.

ගරු සභාපතිතුමනි, මට විනාඩි පහක කාලයක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මේ කියා ගෙන ආවේ මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ යෝජනාව පිළිබඳව අපි ඉතාම ගැඹුරින් සලකා බලා මේ යෝජනාව

[ ගරු කීර්ති උඩවත්ත]

ඉතාම ඉක්මණින් ක්‍රියාවට නැංවිය යුතු යෝජනාවක් විධියටයි. මේ නව මැතිවරණ ක්‍රමය හඳුන්වා දීපු ජේ.ආර් ජයවර්ධන මැතිතුමා ඇතුළු මැතිවරණ ක්‍රම විශේෂඥයන් මෙවැනි ක්‍රමයක් යෝජනා කිරීමට හේතු වුණේ, මේ රටේ ආණ්ඩුවල තිබුණු අස්ථාවර භාවයයි. සමහර ආණ්ඩු විශේෂයෙන්ම 1960 බිහි වුණු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මාස තුනක් ඇතුළත බිඳ වැටුණා. ඒ වාගේම මන්ත්‍රීවරු පිල් මාරු කිරීම නිසා විටින් විට ආණ්ඩු ගණනාවක් නියමිත කාලයට පෙර තමන්ගේ බලය අහිමි වීමේ තත්ත්වයකට මුහුණ දුන්නා. ඒ වාගේම තනි පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂය හැම මැතිවරණයකදීම අද තත්ත්වය නොවෙයි. එදා තත්ත්වය ගත්තාම තනි පක්ෂයක් හැටියට වැඩිම ඡන්ද ලබා ගත්ත පක්ෂය. ඒ පක්ෂයට මේ පැවතුණු කේවල මැතිවරණ ක්‍රමය නිසා ලැබෙන ආසන සංඛ්‍යාවේ අඩුවක් ඒ නායකයන් දැක්කා. ඒ දැකලා තමයි ඔවුන් මේ සමානුපාතික ක්‍රමය යෝජනා කළේ. මම අර මුලින්ම ඉදිරිපත් කරපු ප්‍රකාශයට අනුව තමන්ගේ බලය රැක ගැනීම පමණක්ම සිතා ඇති කරපු මේ සමානුපාතික ක්‍රමය අවසානයේදී එක්සත් ජාතික පක්ෂයටම පාරාවළල්ලක් වී තිබෙනවා. අද මේ ආණ්ඩුව මෙතරම් ශක්තිමත් වෙලා තියෙන්නේ, මේ සමානුපාතික මැතිවරණ ක්‍රමය තුළ ආණ්ඩුවට ලැබුණු ඉතාම විශාල බලය නිසයි. ඒ බලය තුළ ඉද ගෙන වුවත් අපි මේ ක්‍රියාවේ අඩුපාඩුකම් දකිනවා. කවදා හරි දවසක අපි විරුද්ධ පක්ෂයට ගිය දවසක අපිට මේ අහිතකර මැතිවරණ ක්‍රමයේ කනගාටුදායක ප්‍රතිඵල විඳින්නට සිදු වෙනවා.

ඒ නිසා ප්‍රබුද්ධ දේශපාලඥයන් විධියට සියලුම පක්ෂ එකතු වෙලා මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් කතිකාවක් අද දීර්ඝ කාලයක් තිස්සේ අරගෙන ආවා, අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන්. දැන් අපේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ සමානුපාතික ක්‍රමයේත් යම් යම් වාසිදායක තත්ත්වයන් තියෙනවා කියලා. ඒක මම පිළිගන්නවා. නරකම මිනිස්සු අතරින් වඩාත්ම ටිකක් හරි හොඳ මිනිහා තෝරා ගැනීමට අවස්ථාවක් සමානුපාතික ක්‍රමය තුළ තිබෙනවා. අන්න ඒ කාරණය සළකලා බලලා තමයි අනාගතයේදී යෝජනා වන මැතිවරණ ක්‍රමයකදී 70% කේවල ක්‍රමයටත් 30% සමානුපාතික ක්‍රමයටත් අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා ඉඩ කඩ ලබා දෙන්න කියලා යෝජනා වෙන්නේ.

මම නැවත වතාවක් මගේ කථාව අවසන් කරන්න පෙර දැනට යෝජනා වී තිබෙන ප්‍රාදේශීය සභා, නගර සභා පළාත් පාලන මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් යමක් කියන්න කැමතියි. මේ මැතිවරණ ක්‍රමය තුළ නගරාධිපතිවරයා තෝරා ගන්න වෙලා තියෙන්නේ, ඒ අපේක්ෂකයන්ගේ ඡන්දවලින්. ජයග්‍රාහී මන්ත්‍රීවරුන්ගේ ඡන්දවලින්. නමුත් සමානුපාතික ක්‍රමය තුළ ජනතාවට අවස්ථාවක් ලැබෙනවා, පොදුවේ තමන්ගේ නායකයා තෝරා ගැනීම සඳහා බහුතර තමන්ගේ මතය ප්‍රකාශ කරන්න. කොට්ඨාශයක් දිනපු කෙනෙක් නගරාධිපතිවරයා වෙන්නේ අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබුණොත් පමණයි. ඒ සහයෝගය විවිධාකාර ක්‍රමවලින් ලබා ගන්නට පුළුවන්. සමහර විට පක්ෂයේ ඉහළ බලපෑම නිසා වෙන්න පුළුවන්. සමහර විට මුදල් නිසා වෙන්න පුළුවන්. කුල ප්‍රශ්න, ආගම් ප්‍රශ්න නිසා වෙන්න පුළුවන්. නමුත් මම අපේ මන්ත්‍රීතුමාගේ යෝජනාවට යමක් එකතු කරමින් කියන්න කැමතියි. මේ ප්‍රාදේශීය සභා පළාත් පාලන මැතිවරණ ක්‍රමය තුළ සභාපතිවරයා සහ උප සභාපතිවරයා තෝරා ගැනීම සඳහා වෙනම ඡන්දයක් භාවිතා කිරීමට ඉඩ දිය යුතුයි. එහෙම නැතිවුණොත් ඔවුන් ප්‍රාදේශීය දේශපාලනයේ හිර කාරයන් බවට පත් වෙනවා. කවදාවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙන්න බැරුව යනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුවට යන්න බැරි වෙනවා. මොකද, ඔවුන්ට ජනතාව අතර පුළුල් ව්‍යාප්තියකට යන්න තියෙන ඉඩ කඩ ඇහිරෙනවා. ඒ නිසා මම මේ වෙලාවේ කියන්න කැමතියි. මම මේ පිළිබඳව අධ්‍යයනය කරමින් සිටිනවා. ප්‍රාදේශීය සභා සභාපතිවරු නගරාධිපතිරු එක්ක සාකච්ඡා කරලා තියෙනවා. ඉතාම නුදුරු අනාගතයේදී ඉතාම ඉක්මණින් මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මට අවස්ථාව සලසා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මට බාධා කරපු ශ්‍රීනාත් මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.59]

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කරන්න මට අවස්ථාව ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෙම සමානුපාතික ඡන්ද ක්‍රමය එක්සත් ජාතික පක්ෂය විසින් මේ රටට හඳුන්වා

දුන්නත් එදා තිබුණු දේශපාලන වාතාවරණය අනුව අද අපි සියලු දෙනාම පක්ෂ භේදයකින් තොරව පිළිගන්නවා, මෙම සමානුපාතික ඡන්ද ක්‍රමය මේ රටට සුදුසු නැහැයි කියන එක. විශේෂයෙන්ම පසුගිය පළාත් සභා මැතිවරණයේදීත්, ඉන් ඔබ්බට පෙර තිබූ මැතිවරණවලදීත් අප දැක්කා. අපට දැනගන්න ලැබුණා. අපි දුටුවා, මෙහි තියෙන අමිහිරි අත්දැකීම්. විශේෂයෙන්ම පසුගිය වයඹ පළාත් සභා මැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති මනාප පොරය තුළ ආණ්ඩු පක්ෂයේම අපේක්ෂකයන් දෙදෙනෙක් ක්‍රියා කරපු ආකාරය ජනතාවට වරදාන වරප්‍රසාද එහෙම නැත්නම් ජනතාව වෙනුවෙන් දන්සැල් පවත්වමින් මැතිවරණ නීති උල්ලංඝනය කරමින් නොයෙකුත් දේවල් ජනතාවට ලබා දෙමින් කරන ලද මැතිවරණ ප්‍රචාරක කටයුතු අපි දැක්කා. මේ මැතිවරණ කටයුතු සඳහා මෙතරම් මුදලක් වියදම් කරන්න මුදල් කොහෙන්ද ලැබුණේ කියන එක පිළිබඳව ගැටළුවක් ඇති වුණා. අපේක්ෂකයින් දෙදෙනෙකුට පමණක් මෙතරම් විශාල මුදලක් වියදම් කරන්න අවස්ථාව සැලසුනේ කොහොමද කියන ගැටළුව මම හිතන්නේ, මට වාගේම අපේ හිතවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීතුමන්ලාටත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මුදල් මත පදනම් වුණු, බලය සහ අවි ගත් කොටසක් මත පදනම් වුණු මේ ඡන්ද ක්‍රමය, සමානුපාතික ඡන්ද ක්‍රමය වහාම අයින් කරන්න ඕනෑ කියන ඒ ස්ථාවරයේ අපි අනිවාර්යයෙන්ම ඉන්නවා.

ගරු සභාපතිතුමනි මට මතකයි. 2010 හෝ ඒ ආසන්න මැතිවරණයකදී ජනාධිපතිතුමා වේදිකාවක නැගලා කිව්වා. අපේ ස්වාමීන් වහන්සේලා සිය නමක් එහා පැත්තේ වැඩ හිටියා. එතුමා තමන්ගේ දෑත් උස්සලා කිව්වා. අපේ ආදරණීය ස්වාමීන් වහන්ස, මේ ලංකා ඉතිහාසයේ මින් පස්සේ මනාප ක්‍රමයක් ඇති වෙන්නේ නැහැයි කියලා. එතුමා ඉතාමත්ම විශ්වාස කටයුතු ආකාරයට ඒ ප්‍රකාශය ස්වාමීන් වහන්සේලා ඉස්සරහ ප්‍රකාශ කර සිටියා. 2009 වකවානුව තුළ. නමුත් ගරු සභාපතිතුමනි, කනගාටුයි කියන්න. තුනෙන් දෙකක බලයක් මේ රජයට තියෙද්දිත් මේ ව්‍යවස්ථාව වෙනස් කරන්න පුළුවන් හැකියාව තියෙද්දිත් ජනතාව මේක ඉල්ලද්දිත් තවමත් එවන් විශාල බලයක් තියෙන ජනාධිපතිවරයා පවා ක්‍රියාත්මක වෙලා නැහැ රටට අහිතකර මේ මනාප ක්‍රමය අයින් කරන්න. මම දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. සියලුම ජනතාව ඉල්ලනවා නම් පක්ෂ සියල්ලක්ම ඒකමතිකව තීරණය කරලා තියෙනවා නම් අපේ කීර්ති උඩවත්ත මන්ත්‍රීතුමා කිව්වා වාගේ දිනේෂ් ගුණවර්ධන වාර්තාවේ ඒක තියෙනවා නම්, තුනෙන් දෙකක බලයක් තියෙන මේ රජයට මේක අයින් කරන්න බැරි ඇයි කියන එක පිළිබඳව අපට ගැටළුවක් තියෙනවා. ඒ නිසා මේක සද්භාවයෙන් යුතුවද ක්‍රියා කරන්නේ කියන එක පිළිබඳව ගැටළුවක් තියෙනවා. ඒ නිසා අපි කියන්නේ ජනාධිපතිවරයාට සද්භාවයක් තියෙනවා නම්, මේ රජයට සද්භාවයක් තියෙනවා නම් මේ රටේ මේ ව්‍යවස්ථාව වෙනස් කරලා 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගේන්න තිබුණ අවස්ථාවේ ඒක නොවෙයි ගේන්න තිබුණේ. මේ මැතිවරණය වෙනස් කරන එක. නමුත් අනවශ්‍ය ව්‍යවස්ථාවක් ගෙනැල්ලා තමන්ගේ කාලය දීර්ඝ කර ගැනීම වැනි යෝජනා ගෙනැල්ලා, සම්මත කර ගන්නවා මිසක්, රටට වැඩදායී ලෙස ව්‍යවස්ථාවට මේ සංශෝධනය කළේ නැති එක පිළිබඳව අපට විශාල ගැටළුවක් තියෙනවා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් කළා. එතුමා කිව්වා මෙම මැතිවරණ ක්‍රමය තුළ තමන්ට කැමති කෙනෙක් පත්කර ගැනීමේ අයිතිය තියෙනවා කියලා. අපි පිළිගන්නවා. එතකොට සමහර විට තමන් නුසුදුසු පුද්ගලයෙක් හිටියොත් තමන්ගේ මනාපය සුදුසු පුද්ගලයාට දීලා පත් කර ගන්න පුළුවන් හොඳ ක්‍රමයක් මේ තුළ තියෙනවයි කියලා.

ගරු සභාපතිතුමනි, නමුත් මම කියන්න කැමතියි. සුදුසු හෝ නුසුදුසු කියන පුද්ගලයාව ආසන සංවිධායකවරයෙක්, අපේක්ෂකයෙක් හැටියට දාන්නේ ඒ අදාළ පක්ෂය. එතකොට ඒ අදාළ පක්ෂය විසින් නුසුදුසු පුද්ගලයෙක්ව දාන්න විධියක් නැහැ ආසනය තුළ. එහෙම නැත්නම් ඡන්ද අපේක්ෂකයෙක් හැටියට. ඒ නිසා ඒ දේශපාලන පක්ෂය කියා සිටිනවා නම් ඔහු තමයි ඒ මැතිවරණ කොට්ඨාශය තුළ ඉන්න හොඳම මනුස්සයා, ඒ පක්ෂය වෙනුවෙන් ඡන්දය ඉල්ලන්න. එහෙම නම් ඒ පාක්ෂිකයාට ඡන්දය දෙනවා. ඒ නිසා මම දකින්නේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කියමනත් හරි වාගේම, ඒක ඒ ආකාරයෙන් නිවැරදි විය යුතුයි. මොකද, අපි ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක හැටියට අපේ විශාල වගකීමක් තියෙනවා, මේ රටට පූර්වාදර්ශයක් දෙන්න. මොන ආකාරයේ අපේක්ෂකයෝද අපි පත් කරන්න ඕනෑ? අපේ ක්‍රියාදාමය මොකක්ද? අපි රටට දිය යුතු ආදර්ශය මොකක්ද කියන එක මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වාගේම අනෙකුත් දේශපාලන පක්ෂවලටත් තියෙන අයිතියක්.

ගරු සභාපතිතුමනි, අපි නිතර නිතර මේ යෝජනාව පළාත් සභාව තුළ ගෙනැල්ලා වෙන යම් ස්ථානවල කථිකා

[ ගරු කිත්සිරි මංචනායක]

කරගත්තත් වැඩක් නැහැ. මෙය සද්භාවයෙන් යුතුව කරන්න නම් ඇයි තව තවත් පරක්කු වෙන්නේ? මේ අවශ්‍ය කරන්නා වූ තුනෙන් දෙකක බලය මේ ආණ්ඩුවට තියෙනවා. ඇයි මේක පමා කරන්නේ? ඇයි මේ දිනෙන් දින පස්සට දාන්නේ? මීට අවුරුදු පහකට ඉස්සෙල්ලා ස්වාමීන් වහන්සේලා ඉදිරියේ ජනාධිපතිතුමා තමන්ගේ පපුවට තට්ටු කරලා කිව්වා, මේ ශ්‍රී ලංකා ඉතිහාසයේ පවත්වන අන්තිම මනාප මැතිවරණය කියලා. එහෙම කියපු ජනාධිපතිතුමා ඇයි මේක ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. මේක තියෙන්නේ ඔබතුමාලාගේ අතේ. ඔබතුමාලාගේ ආණ්ඩු බලය තියෙනවා. ඔබතුමාලාගේ පක්ෂය තුළින් ඉහළට යම්කිසි පීඩනයක් ඇති කරන්න අනිවාර්යයෙන් මෙය කළ යුතුයි කියලා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය හැටියටත්, අපි ප්‍රධාන විපක්ෂය හැටියටත් අපි අපට හැකි සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මේ කාලෝචිත යෝජනාව ගෙනාපු ඒ මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මින් අවසන් කරනවා.

[අ.භා. 12.06]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගරු සභාපතිතුමනි, අපි ඉතාමත්ම සතුටු වෙනවා. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් සියලු දේශපාලන කොටස් මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව පොදු එකඟතාවයක් ප්‍රකාශයට පත් කරමින් සිටිනවා. ඉතාම සියුම් ලෙස ආරම්භ කරපු මේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුය කියන ස්ථාවරය, එදා ඉඳන් දරපු දේශපාලන ව්‍යාපාරයක් විධියට අද පළාත් පාලන මට්ටමේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය අවසන් එකඟතාවයකට එළඹිලා තියෙන අවස්ථාවක පළාත් පාලන සහ පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රම සඳහාත් එවැනි මැතිවරණ ක්‍රමයක් සැකසිය යුතු යැයි කියන යෝජනාව සාකච්ඡාවට ගැනීම ඉතාම සතුටක් අපට දැනෙනවා. විශේෂයෙන්ම අප වඩාත් අවධාරණය කරන්නේ. මේ පවතින මැතිවරණ ක්‍රමය තුළින් අද ඇති වෙලා තියෙන්නේ, සංවර්ධනය ඉලක්ක කරගත්ත මහජන නියෝජිතයා වෙනුවට මැතිවරණ ජයග්‍රහණය කරන මහජන නියෝජිතයෙක් බවට අපේ රටේ දේශපාලනය සහ මහජන නියෝජිතයාගේ කාර්යය පරිවර්තනය වෙලා තියෙනවා. මෙය සාකච්ඡාවට ලක් කළ යුතු සුවිශේෂ ශාස්ත්‍රීය කරුණක් ගරු සභාපතිතුමනි. ඡන්දය දිනන්න ඉදිරිපත් වන මහජන නියෝජිතයෝත් රටේ සංවර්ධනය වෙනුවෙන් කැප වුණු මහජන නියෝජිතයෝත් අතර පරතරයක් තියෙනවා. ගරු සභාපතිතුමනි අද සිද්ධ වෙලා තියෙන්නේ, සංවර්ධනය වෙනුවෙන් උපාය මාර්ග සකස් කරන, සංවාද කරන වැඩසටහන් වෙනුවට මේ පැවැත්වෙන මැතිවරණ ජාලය තුළ කෙසේ හෝ තමා ගොඩ ඒම සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන මහජන නියෝජනය තමයි ඇති වෙලා තියෙන්නේ. ඒ නිසා මම දන්නවා. සමහර මහජන නියෝජිතයෝ මුළු දවස පුරාම මරණ ගෙවල් කරා ගමන් කරනවා. මරණ ගෙවල්වලට යන එක විශේෂ අවස්ථාවලට සහභාගි වන එක හොඳ දෙයක්. නමුත් මහජන නියෝජිතයාගේ කාර්ය භාරය ඊට වඩා වෙනස් විය යුතුයි. රටේ සමාජ ගැටළු ගැන ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනයක් කෙරෙන, ඒ පිළිබඳව අලුත් ක්‍රමෝපායන් විධික්‍රමයන් සකසන තැනැත්තෙක් බවට මහජන නියෝජිතයා පත් විය යුතු වෙනවා. එහෙත් අද මළ ගෙවල්වල නිදි මරණ හිස් ප්‍රලාප කථා කරන හිස් මිනිස්සු බවට මහජන නියෝජිතයෝ පරිවර්තනය වෙලා තියෙනවා. එය තමයි මේ රටේ මේ හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමය තුළ අපේ රටේ සංවර්ධනය වෙත විශාල බාධාවක් වෙලා තියෙන බව ඔප්පු කරන සාධකය වෙන්නේ. ඒ නිසා මෙය ඉවත් කළ යුත්තේ වෙන වෙන කථා නිසා නොවෙයි. මේ මැතිවරණ ක්‍රමය අද පුද්ගලයා ඉස්මතු කරන මැතිවරණ ක්‍රමයක් බවට පරිවර්තනය වෙලා තියෙනවා. ඒ නිසා පුද්ගලයා වෙනුවට රට ගොඩ නගන, රට සංවර්ධනය කරන වැඩ පිළිවෙළකට අපේ රට සමස්ථ ජාතිය රැගෙන යන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කියන යෝජනාවට පිවිසෙන්නේ.

ගරු සභාපතිතුමනි, ජේ.ආර් ජයවර්ධන ජනාධිපතිතුමා මේ මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙද්දි කිව්වා, සමාජයේ ඉන්නවා විවිධ කණ්ඩායම්. විවිධ පැති කෝණවල මිනිස්සු. මේ හැම තැනැත්තෙක්ම නියෝජනයක් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා තමයි, මේ මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙන්නේ කියලා. කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්ව කරුණුවලට අමතරවයි මම මේ කරුණ එක් කරන්නේ. එතුමා ඉතා වැදගත් කරුණු ඉදිරිපත් කළා. ඒ කාරණා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණා.

නමුත් අද ඇත්ත වශයෙන්ම ඒ විවිධ සමාජ කණ්ඩායම්වල නියෝජිතයින් ලෙස පත්වන්නේ කවුද? කුඩු විකුණන එකා හිතනවා, කුඩු විකුණන මිනිස්සු හිතනවා, කුඩු රජෙක්, කුඩු කාරයෙක්ව තමුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කථා කරන්න පාර්ලිමේන්තුව හෝ එවැනි මහජන නියෝජිත ආයතනවලට දාන්න ඕනෑය කියලා. අරක්කු විකුණන මිනිස්සු, නීති විරෝධී වඩ කරන මිනිස්සු, ගණිකා මඩම් මෙහෙයවන මිනිස්සු තමුන් වෙනුවෙන් පෙනී සිටින මහජන නියෝජිතයින් නිර්මාණය කිරීම සඳහා තමයි දේශපාලනය හසුරුවන්නේ, මෙහෙයවන්නේ. එහෙනම් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එදා විවිධ සමාජතලවල මිනිස්සු නියෝජනය කෙරෙන මැතිවරණ ක්‍රමයක් කියලා කිව්වාම සමාජයේ පහත් පෙලේ සමජ විරෝධී ක්‍රියාවන්වල නියැලෙන තැනැත්තෝ ඔවුන් නියෝජනය කරන මහජන නියෝජිතයෙක් සඳහා තමයි පෙළ ගැහෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පෞද්ගලික ගුරුවරුන්ගේ -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

පෞද්ගලික ගුරුවරු නියෝජනය කරන්නත්, නියෝජිතයෝ පත් කරලා තියෙනවා. ඉතා වැදගත්. හොඳ දෙයක්. අධ්‍යාපනය පිළිබඳ දැක්මක් පාසල් ගුරුවරයාට වාගේම පෞද්ගලික ගුරුවරයාටත් තියෙනවා. ඒ නිසා පෞද්ගලික පන්ති ගුරුවරු ඉතා හොඳින් තේරුම් අරගෙන තියෙනවා අපේ මිනිහෙකුත් මේ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව විධිමත් අදහස් ඉදිරිපත් කරන්න හිටියොත් හොඳයි කියලා. ඒ නිසා තමයි පෞද්ගලික පන්ති ගුරුවරු ඒ වෙනුවෙන් මෙහෙයවන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම විවිධ සමාජ කණ්ඩායම්වල විවිධ සමාජ බලවේග රටේ විවිධ සමාජ නරක ක්‍රියාවල යෙදෙන තැනැත්තන්ගේ නියෝජිතයින් පළාත් පාලන ආයතන තුළ, පළාත් සභා තුළ පාර්ලිමේන්තුව දක්වා ගමන් කරලා තියෙනවා. ඒ නිසා ඊයේ පෙරේදා ගරු සභාපතිතුමනි, සුළු වැරැද්දකට මහර මහේස්ත්‍රාත් අධිකරණයේදී චෝදනා ලබපු තරුණ දරුවෙක් අත්අඩංගුවට පත් වුණා. රිමාන්ඩ් භාරයට පත් වුණා. ඒ වෙලාවේදී ඔහු එළියට ආපු වෙලාවේ අපේ නීතිඥ මහත්මයෙක් ප්‍රශ්න කළා, හරි අමාරුවෙන් නේද මේ දවස් හත හිටියේ, රිමන්ඩ් එකේ ඉන්න එක ඉතාම අසිරු වැඩක් නේද කියලා. ඒ වෙලාවේ ඒ තරුණයා කියනවා, අයියෝ කිසි ප්‍රශ්නයක් නැහැ සර්. ඒකේ ඇතුළේ දැන් ප්‍රාදේශීය සභාවල සභාපතිවරු රොත්තයි. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු ඕනෑ තරම්. මන්ත්‍රීවරු මහජන නියොජිතයෝ, ස්වාමීන් වහන්සේලා, ගුරුවරුන්, විදුහල්පතිවරුන් තමයි මේ ඇතුලේ ඉන්නේ. රටේ සමස්ත සමාජ සංස්කෘතියේ බරපතළ පිරිහීමකට ලක්වෙලා තියෙනවා. මේ මැතිවරණ ක්‍රමය විසින් මෙහෙයවපු විවිධ සමාජ බලවේග, අද මේ රටේ අවුල් සදාචාර විරෝධී අධ්‍යාත්මික මාර්ගයෙන් මිදුණු මහා නරා වළකට සමාජය තල්ලු කරයි යන භයානක ඛේදවාචකයේ කොටසක් බවට, වගකිවයුත්තන් බවට අද පරිවර්තනය වෙලා තියෙනවා. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය තුළ අසීමාන්තික වු මුදල් කන්දරාවක් සමාජය මත වපුරන්න සිද්ධ වෙලා තියෙනවා. ජයග්‍රහණය කිරීම නොවෙයි, අද තමුන් මැතිවරණය සඳහා ඉල්ලන බව පෙන්වන්න, ප්‍රසිද්ධ කරන්න, ජනතාව අතරට ගෙනියන්න- මිනිස්සු, හොඳ මිනිස්සුන්ට ඡන්දය දෙයි. ඒ ගැන තර්කයක් ඇත්තේ නැහැ. උසස් දේ අගය කරන මිනිස්සු ඉන්නවා. එත් මේ මැතිවරණ ක්‍රමය තුළ තමා මහජන නියෝජිතයෙක් වශයෙන් අපේක්ෂකයෙක් ලෙස ඉදිරිපත් වෙනවා කියන, සරල ප්‍රචාරක ව්‍යාපාරය තුළ අපි විශ්වාස කරන්නේ නැහැ, සාමාන්‍ය ඇත්ත පන්තියේ මිනිහෙකුට මේ මැතිවරණ ක්‍රමය තුළ හිස ඔසවන්න නම්, ඔහු සුවිශේෂ හැකියාවන් තියෙන, සුවිශේෂ හේතු සාධක සහිතව අතීතයේ ක්‍රියා කරපු තැනැත්තෙක් නම් මිස ඔවුන්ට ඒ සඳහා ඉඩකඩ හම්බවෙන්නේ නැහැ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය තුළින් එවැනි තත්ත්වයකට රට තුළ මුදල් මත සක්‍රීය වෙලා තියෙන මැතිවරණ ජාලයක් තුළට අපේ රටේ ජනයාව පරිවර්තනය කරලා තියෙනවා ඒ නිසා අසීරු ඉලක්ක ජයග්‍රහණය කරලා තියෙනවා.

මට මතකයි, වාසනාවකට දිනේෂ් ගුණවර්ධන ගරු ඇමතිතුමා ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීමේ යෝජනාව මැතිවණයට හඳුන්වා දීම නිසා අපේ ආණ්ඩුව, එක්සත් නිදහස් සන්ධාන රජය විධියට ඒ මතය පිළි අරගෙන මැතිවරණ කොමසාරිස්තුමා නියම කරන නිසා, යම්තම් හොර ඡන්ද උගුලෙන් අපි බේරෙනවා. හොර ඡන්ද දැමීමේ උගුලෙන් අපි බේරෙනවා. එත් ඡන්ද ගණන් කිරීමේ උගුලෙන්, ඒ මනාප ගණන් කිරීමේ උගුලෙන් අපට බේරෙන්න බැරි තත්ත්වයකට පරිවර්තනය වෙලා තියෙනවා. ඒ නිසා අවිශ්වාසය, මේ මැතිවරණ ක්‍රමය තුළින් ඇති වෙන ප්‍රතිඵල සැබෑ මහජනයාගේ මතය ද කියන කාරණය පිළිබඳව බරපතළ අවිශ්වාසයක් මිනිසුන්ගේ

[ ගරු සිසිර ජයකොඩි]

හදවත් තුළ පැන නඟිනවා. සාමාන්‍ය මිනිස්සු තුළ තියෙන්නේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

හරියට ගැන්නා නම් පාර්ලිමේන්තුවේ අද.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ මිනිසුන් පාර්ලිමේන්තුවේ නැහැ. ඒකයි කණගාටුව. ඒ නිසා මැතිවරණ ක්‍රමය ගැන විතරක් නොවෙයි. මේ මැතිවරණ ක්‍රමය මත ඇති කරන ඡන්ද ගණන් කිරීමේ ක්‍රමය පිළිබඳවත් මේ මැතිවරණ ක්‍රමය විසින් අවිශ්වාසය ජනිත කරලා තියෙන්නේ. මේ අවිශ්වාස සහගත මනාප ගණන් කිරීමේ ක්‍රමය දක්වා මේ මැතිවරණ ක්‍රමයේ නරාවළට අපේ සමාජය තල්ලු කරලා තියෙනවා. ඒ නිසා ඇති කරලා තියෙන්නේ, වෛරය, ක්‍රෝධය. හැම විටම තව කෙනෙක් අභිබවා, තව කෙනෙක් නැඟී සිටීම පිළිබඳව පටු ආකල්පය. ඒ හැර රට පිළිබඳව හැඟීම අපේ සමාජයෙන් තුරන් කරලා තියෙනවා. ඒ නිසා මහා ආධ්‍යාත්මික විනාශයක් කරන අපේ රට නරාවළකට තල්ලු කරපු, අවිශ්වාසදායක මැතිවරණ ක්‍රමයක් බව මේ පවතින මැතිවරණ ක්‍රමය තුළින් අපට පේනවා. එයින් මුදවා ගැනීම සඳහා නැවත නැවතත් මෙවැනි යෝජනා ඉදිරිපත් කරන්න අවශ්‍ය ශක්තිය මේ සභාවට හැකියාව ලැබෙන්න ඕනෑ. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය පිරිනමමින් ඔබ සැමට ගෞරවය පිරිනමමින් නිහඬ වෙනවා ස්තුතියි.

[අ.භා. 12.17]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මැතිවරණ ක්‍රමය සංශෝධනය විය යුතුයි යෝජනාවට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරපු ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සමඟ මම පුද්ගලිකවත් කථා කළා. ඒ කථා කරපු කාරණාවලින් කිහිපයක් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ අතිනුත් ඉදිරිපත් වුණා. ඒ තමයි මැතිවරණ ක්‍රමය සංශෝධනය කරද්දී, දැන් සංශෝධනය කරලා තියෙන මැතිවරණ ක්‍රමය තමයි පළාත් පාලන මැතිවරණ ක්‍රමය. ඒ මැතිවරණ ක්‍රමයේදී ප්‍රාදේශීය සභා නියෝජිතයා ප්‍රදේශයක සිරකරුවෙක් බවට පත් වෙන ඒ උදාහරණය කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා බොහෝම අපූරුවට කිව්වා. ඇත්තටම ඒකයි සිද්ධ වෙන්නේ ගරු සභාපතිතුමනි. දැනට යෝජනා වෙලා තියෙන, දැනට සම්මත වෙලා තියෙන ඒ පළාත් පාලන මැතිවරණ සංශෝධනය අනුව, උදාහරණයක් කිව්වොත් කොට්ඨාශයකට සමහර විට ග්‍රාම සේවක එක් වසමක් වගේ අයත් වෙන්නත් පුළුවන්. ජන අනුපාතය අනුව. දැන් ඒ මන්ත්‍රීවරයාට වැඩ කටයුතු කරන්න සිද්ධ වෙන්නේ, ඒ ඒ කොට්ඨාශය තුළ විතරයි. ඔහුට පළාත් සභා මැතිවරණයට තරග කරන්න යද්දී ඔහු දැන හඳුනා ගෙන තියෙන ග්‍රාම සේවා වසම හෝ දෙකෙහි ඒ ඡන්ද ප්‍රමාණයෙන් ඔහුට පළාත් සභා මැතිවරණයට තරග කරන්න බැහැ. මේ ප්‍රායෝගික ගැටළු මතු වුණු තැන් මේකේ. ඒ වගේම සභාපතිවරයා ඉවත් කර ගැනීමේ තිබෙන හැකියාව, සල්ලි දීලා කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියට. ඒ වගේ ගැටළු කාරණා ගොඩක් මේ සංශෝධනය කරපු එක තුළ පවා තියෙනවා.

ඊළඟ කාරණය තමයි, මේ අනුව කොට්ඨාශ මට්ටමින් පළාත් සභා මැතිවරණ ක්‍රමය ද, ආසන මට්ටමින් පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ද පැවැත්විය යුතුයි කියන යෝජනාව. දැන් පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් - පළාත් සභා ක්‍රමය මේ රටට නුසුදුසු, නොගැළපෙන ආයතනයක් කියන විශ්වාසය අප තුළ තියෙනවා. ඒ සඳහා අපි අදත් මේ පළාත් සභාව වෙනුවෙන් පෙනී සිටින්නේ. මේ ක්‍රමය අහෝසි කළ යුතුයි. එය අහෝසි විය යුතුයි කියන යෝජනාව තියෙනවා. මීට ඉහත පැවති ක්‍රමය තුළ ආසනයට හිටියා නියෝජිතයෙක්. ඒ ආසනයේ නියෝජිතයා ඒ ආසනයේ මහජනතාව හඳුනනවා. ඔහුගේ මළ ගෙයට, මඟුල් ගෙයට, දානේ ගෙයට, බණ ගෙයට සහභාගි වෙලා ඔහු සල්ලි වියදම් කරලා නැහැ. ඔහු මිනිසුන් දැන හඳුනා ගත්තේ ඒ ඒ ජනතාවත් එක්ක සමීපව කටයුතු කිරීමෙන්. හැබැයි, මේ දිස්ත්‍රික්කය පුරා දුවන ගමනේදී ආසනයක් නියෝජනය නොකර, සල්ලි වියදම් නොකර, මැතිවරණයක් ජයග්‍රහණය කරන්න බැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා තමයි පසුගිය කාල පරිච්ඡේදය පුරාම සල්ලි තියෙන කෙනා, සල්ලි වැඩියෙන් වියදම් කරපු කෙනා පාර්ලිමේන්තුවට හෝ පළාත් සභාවට හෝ ප්‍රාදේශීය සභාවට තේරී පත් වුණේ.

දැන් මේ විධියට අඩුපාඩුකම් ගොඩක් තියෙනවා. විශේෂයෙන් මේ අඩුපාඩුකම් මැද්දේ ජනතා විමුක්ති පෙරමුණේ අපි මැතිවරණයට තරඟ කරපු ආකාරයත් ඔබතුමා දකිනවා. විශේෂයෙන් අපි ජනතා විමුක්ති පෙරමුණ විධියට තනිව තරඟ කරද්දී, අපි අතර මනාප තරගයක්, අපි ඒ බලු පොරයට වැටුනේ නැහැ. එකේ ඡන්ද ලැබුණද නැද්ද කියන එක වෙනම කාරණයක්. හැබැයි, අපි ආදර්ශමත් විධියට ප්‍රතිපත්තිමය කාරණා ඉදිරිපත් කරමින් පක්ෂය ඉස්සරහට තියලා, පුද්ගලයා වෙනුවට පක්ෂය ඉදිරියට තියලා මේ පක්ෂයේ මේ ප්‍රතිපත්තිවලට ඡන්දය දෙන්න කියන ඒ ඉල්ලීම තමයි අපි ජනතාවගෙන් ඉල්ලා සිටියේ. මැතිවරණවලදී අපි ඉදිරිපත් වුණෙත් ඒ ආකාරයට. ඒ නිසා මේ කුමන මැතිවරණ ක්‍රමයක් තුළ වුණත්, ජනතා විමුක්ති පෙරමුණ අනුගමනය කරන මේ ප්‍රතිපත්තිය නිසා අපිට ගැටළුවක් නැහැ ගරු සභාපතිතුමනි.

දැන් ප්‍රශ්නය තියෙන්නේ මෙතන නොවෙයි ගරු සභාපතිතුමනි. මේ මැතිවරණ සංශෝධන, අර ගමේ භාෂාවෙන් කියනවා නම්, පය බරවාවට පිට කර බෙහෙත් බැදීම වගේ යෝජනා තමයි වී තියෙන්නේ. ඇත්ත ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමනි, මැතිවරණ ක්‍රම පැවැත් වීමේ ක්‍රමය ඇතුළේ. 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගත්තට පස්සේ, ඒ 18 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ තිබුණු ස්වාධීන මැතිවරණ කොමිසන් සභාව ඇතුළු ඒ කොමිසන් සභා ටික, අහෝසි වීම තුළ දැන් සමාන තරගයකට ඉදිරිපත් වෙන්න බැහැ. සමාන තරගයට ඉදිරිපත් වෙන්නේ නැතුව අවසාන ප්‍රතිඵලය විග්‍රහ කර දක්වද්දී අර සල්ලි තියෙන, එහෙම නැතිනම් ජනාධිපතිතුමා හෝ ඒ විධායක බලයේ ආශිර්වාද ලබන පුද්ගලයන්ට මේ ජයග්‍රහණය ලබා ගන්නවා කියන එක හරිම පහසු කටයුත්තක් බවට පත් වෙලා තියෙනවා. මොකද ගරු සභාපතිතුමනි, 78 ව්‍යවස්ථා සංශෝධනයේදී ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ගරු ජනාධිපතිතුමා බවට පත් වෙද්දී ඔහු, ජනාධිපතිවරයාගේ ධූර කාලය අවස්ථා දෙකකට සීමා කළා. ඒ සීමා කළේ කිසිවක් නිසා නොවෙයි. තුන්වන ධූර කාලයෙන් පස්සේ සිටීමේ සදාචාරාත්මක අයිතියක් නැහැ. ඒක වෙනත් කෙනෙකුට ලබා දිය යුතුයි. ගරු සභාපතිතුමනි, මේ විධායක බලයේ තියෙන අනුහසින්, මේ සමාජය අන්ත දූෂිත බවට පත් වන බවට අපට එදා ඒ උදාහරණවලින් පේන්න තිබුණා. අන්න ඒ නිසා තමයි මේ ව්‍යවස්ථාව තුළ ධූර කාලය වාර දෙකකට සම්මත කර ගත්තේ. දැන් සිද්ධවෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි, 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ මේ ජනාධිපතිතුමා කොච්චර කාලයක් ඉන්නවා ද කියලා අද කාටවත් සහතික කරන්න බැහැ. ඒ නිසා ඕනෑම ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් අතිගරු ජනාධිපතිතුමාගේ ඒ සංකල්පය පරිදි මහින්ද චින්තන ඉදිරි වැඩ පිළිවෙළ අනුව කියන ඒ වචන පෙළ නොකියා ඔහුට කථාවක් කර ගන්න බැහැ ගරු සභාපතිතුමනි. මෙන්න මේක තමයි ඇත්ත තත්ත්වය. එහෙම කථාවක් කළොත්, වෙනත් විධියට ඔහුගේ ඒ ඒ දේශපාලනයත් එතැනින්ම අහෝසි වීමේ ඒ කනගාටුදායක අත්දැකීමකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපි දන්නවා ගරු සභාපතිතුමනි අද මේ ජනාධිපතිතුමා මැතිවරණ පවත්වන ක්‍රමය-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකේ වරදක් තියෙනවා ද ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ජනාධිපති ධූරයේ ආනුභාවයෙන්, අනුහසින් පවත්වන මැතිවරණ අර අසමාන විධියට පවත්තලා ප්‍රතිඵල විග්‍රහ කර ගැනීම සාධාරණ කරුණක් බවට පත් වෙලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අනේ මේ පැරදිලා පැරදිලා, ලැජ්ජා නැතිව කියවනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි දන්නවා, මේ පැවති වයඹ හා උතුරු පළාත් සභා මැතිවරණයේදී, ගමේ තියෙන ඡන්ද රුස්වීම්වලට ගියා. දැන් ඡන්ද ඉල්ලන්නේ කාටද ගමේ ඉන්න අපේක්ෂකයාට නොවේ පළාතේ ඉන්න අපේක්ෂකයාට නොවෙයි. මගේ වැඩ පිළිවෙළට. පළාතේ ඉන්න අපේක්ෂකයාට නොවෙයි. පපුවට දෙපාරක් තුන් පාරක් ගහගෙන කියනවා, මගේ වැඩ පිළිවෙළට ඉදිරියට ගෙන යන්න සහයෝගය දෙන්න. ඉතින් මෙහෙම කියද්දී මිනිස්සු බලනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මිනිස්සු දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මිනිස්සු ඡන්දේ දෙනවා. ඇයි තව කොච්චර කාලයක් ඉඳීද කියලා විශ්වාස නැහැ. ඇයි වෙන කෙනෙකුට පත් වීමට ඉඩකඩ නැහැ. වෙනදා දෙවන ධුර කාලයේ අවසාන අවුරුද්ද වන විට අපි දකිනවා ගරු සභාපතිතුමනි, අර ගිලෙන නැවෙන් මීයෝ පනිනවා වගේ - දැන් බලනවා, මේ ජනාධිපතිතුමාට දෙවෙනි ධුර කාලයෙන් පස්සේ තුන්වන වතාවට එන්න බැහැ. ඉතින් ඊළඟට එන කෙනා තෝර ගන්න හෙමින් හෙමින් යටින් deal දාගන්නවා. ඒක තමයි සිද්ධ වුණේ. ඒ අනුව තමයි ඊළඟ ජනාධිපතිවරයාට ඒ අවස්ථාව ලැබුණේ. හැබැයි -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අද එක්කෙනයි ඉන්නේ. ලබන පාර ඕකත් නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් කාටත් කොන්ද නමා ගෙන, කොන්ද කඩා ගෙන, වලිගය පිටිපස්සේ ගහගෙන, නකුට පස්ස පැත්තේ ගහගෙන වැඳ වැටෙන්න සිද්ධවෙනවා. වැන්දේ නැත්නම් පයින් ගහනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නකුටත් නැහැ. ලබන පාර ඕකත් නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඊයේ පෙරේදා, අර එස්.එම්. චන්ද්‍රසේන ගරු මන්ත්‍රීතුමා කලා වැව සංවිධායක ධූරය ගනිද්දී මම දැක්කා, දෙපා අල්ලලා වැඳ වැටුණේ. ලැජ්ජයි. කොඳු බිඳ දමාගෙන - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

කොඳු බිඳ දමාගෙන හැසිරෙනවා රූපවාහිනී මාධ්‍ය ඉස්සරහා අපි දැක්කා. මොන තරම් විළිලැජ්ජා නැති දර්ශනයක් ද ගරු සභාපතිතුමනි. දෙකට නැමිලා සංවිධායක ධූරය ගන්නේ. ඇයි? දන්නවා ඉතිං එතුමාට ජනාධිපති වරමේ අනුහසින්, ආනුභාවයෙන් ඔහුට තවත් චිරාත් කාලයක් ඒ සංවිධායක ධූරය දරා ගෙන ඉන්න පුළුවන් විධියට මාර්ගය ඔහුට හදා ගෙන ඉන්න පුළුවන් බව. හැබැයි, අපි දන්නවා කොන්දක් ඇතිව එදා බර්ට් ප්‍රේමලාල් දිසානායක ඇමතිතුමාගේ පුතා, ඒ පියාගේ අවමංගල උත්සවයේදී කථාවක් පැවැත්වූවා. හැබැයි, අපි දන්නවා. එතුමාට දැන් උදාහරණ තියෙනවනේ? ගරු සභාපතිතුමනි, අපි කියමු මැතිවරණවලින් ජයග්‍රහණය කර ගත්තා කියලා. ජයග්‍රහණය කරගත්තට පස්සේ මහඇමතිවරු පත් කිරීම් කර ගන්නේ කවුද? මහ ඇමතිවරු පත් කරන්නේ ජනාධිපතිතුමා. හැබැයි පත් කරද්දී එක තැනකට එක ක්‍රමවේදයක්. තවත් තැනකට තව ක්‍රමවේදයක්. එක තැනකට කියනවා. මේ පත් කරන්නේ, වැඩිම මනාප ගත්ත නිසා කියලා. ඊළඟට කියනවා ජ්‍යෙෂ්ට අනුව කියලා. දැන් සියල්ල පාලනය කරන්නේ ගරු සභාපතිතුමනි, මෙන්න මේ විධායක ජනාධිපතිවරයා විසින්. ඔහු තමයි මේ සියල්ල පාලනය කරන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඉතින් ඇත්ත නේ?

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඇත්ත තමයි. ඒක නරකයි ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයකට ඒ විධායක බලයේ අනුහස තමන්ගේ පක්ෂයට. විපක්ෂයට නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විජේවීරගේ ඒකාධිපතිකම හොඳයි

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තමන්ගේ පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදයට මෙන්ම රටේ ප්‍රජාත්‍රන්ත්‍රවාදයන්ට බරපතල ගැටළු ඉදිරිපත් කරනවා ගරු සභාපතිතුමනි. ඒනිසා මේ ප්‍රජාත්‍රන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ අයිතියෙන් අපි ඉල්ලා සිටිනවා කීර්ති උඩවත්ත වගේ ගරු මන්ත්‍රීවරු, හෘදය සාක්ෂියේ ඇත්ත එළියට එන මන්ත්‍රීවරු. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීවරු වගේ ඇත්ත

හෘදය සාක්ෂිය එළියට එන මන්ත්‍රීවරු. ගරු සභාපතිතුමනි, ඇත්ත ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ හෘදය සාක්ෂිය අවදි කළ යුතු කාලය ඇවිල්ලා තියෙනවා, පක්ෂයේ ඇතුලේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමට. එතැනින් පස්සේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනිමට. ඒ නිසා විධායක ජනාධිපති ධූරය පවතින තාක් කල් මේ සංශෝධන කිසිවක් වලංගු නැහැ සභාපතිතුමනි. වලංගු වන්නේ එකම එක අධිකාරි බලයක්. ඒ විධායක බලයේ බල මහිමය පමණක්මයි. ඒ නිසා මෙතැනින් මේ සංශෝධන කිසිවක් ගෙනාවත් මේවා සාධාරණ නැහැ ගරු සභාපතිතුමනි. කිසිවක් එලදරන්නේ නැහැයි කියන කාරණය මේ සභාවට ඉදිරිපත් කරනවා. බොහෝම ස්තූතියි.

[අ.භා. 12.27]

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම පළමුව මේ යෝජනාව සම්බන්ධව අදහස් දක්වපු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ගෞරවනීය ස්තූතිය මේ අවස්ථාවේදී පුද කරනවා. අපේ සමහර කරුණු දිහා බලපුවාම, ඇත්තටම අපි සමහරක් වේලාවට හිතන කොට අපි එකඟවෙන දේවල් ගොඩක් දුරට - මම ඇත්තට කීර්ති උඩවත්ත ජ්‍යෙෂ්ට ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ දේ බැලුවා ම අපිට එකඟවෙන්න පුළුවන් ගොඩක් දේවල් එහි තිබුණා. අළුත් පළාත් පාලන මැතිවරණ ක්‍රමය පිළිබඳව පැහැදිලිවම මට ලොකු අත්දැකිමක් නැති වුණත්, අපිට යම්තාක් අත්දැකිමක් තිබුණා. නමුත් එතුමා කිව්වා වගේ මම දැකපු දේ තමයි මේ සභාපති, උපසභාපති තෝරන වේලාවේදී මාත් ඉතින් මතක් කරන්න ඕනෑ. මේ මනාප ක්‍රමය නිසා තමයි මමත් මේ පළාත් සභාවට තේරී පත් වුණේ. මේ මනාප ක්‍රමය තිබුණේ නැතිනම්, මම තාමත් ගම් සභා මන්ත්‍රීවෙන්න තිබුණා. හැබැයි, මේකේ ලොකු භයානක පැති තිබුණා. ඒ භයානක පැති දැකපු නිසා තමයි මේ යෝජනාව දැම්මේ. මේක සංශෝධනය කරන කොට කිර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා, පනතට සංශෝධන සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනවා කියලා. ඒකට මගේත් සම්පූර්ණ එකගතාවය පළ කරනවා. මොකද, සභාපති, උපසභාපති තෝරන ඒක ජනතාව අතට දුන්නා නම් ගොඩක් වෙලාවට ඒක හොඳ ජනතා තින්දුවක් වෙනවා. නැතිනම් පැහැදිලිවම ගොඩක් වෙලාවට අපි දැකපු දේ තමයි මේ සභාපති, උපසභාපතිකම් ගැනීමේදී ගොඩක් වෙලාවට ඒ ආසන සංවිධායක විරසක නම්, සංවිධායක තරහ නම්, එයා කොපමණ හොඳ, උගත් පුද්ගලයෙක් වුණත්, කොපමණ ජනතාව පිළිගත්තත් එයාට එන්න බැරි වෙනවා. ඉතින් ඒ නිසා ඒක ජනතාව අතට දෙන එක පැහැදිලිවම හොඳ දෙයක්. එකත් එක්කම මේ අයවැය පරාජය. පැරණි ක්‍රමය අනුව පැහැදිලිවම අයවැය තුන්පාරක් දාලා, තුන් වෙනි පාර පරාජය වුණොත් එහෙම අයවැය සම්මත වුණා සේ කටයුතු කරන්න පුළුවන්. මේකේ හොඳ නරක දෙපැත්තක් තියෙනවා. අපි දැකපු දේ තමයි. ප්‍රාදේශිය සභාවේ, සභාපතිවරු හැටියට හිටපු නිසා අපි දැකපු දේ තමයි බැරි වෙලාවක්වත් අර කියපු විධියට සල්ලිවලට මන්ත්‍රීවරු ටික ගන්න පුළුවන් වුණොත් කොච්චර හොඳ සභාපතිවරයෙක් වුණත් පරාජය කරන්න පුළුවන්. ඒ වගේම තමයි ඒ පනතත් එක්ක මම දැකපු දේ තමයි, සභාපතිවරයෙකුට අහුවෙනේන් නැතිව ඕනෑ තරම් වැරදි කරන්න පුළුවන් තැනුත්, ඒ පළාත් පාලන පනතේ පැහැදිලිවම තියෙනවා. ඉතින් ඒ සංශෝධන සඳහා යෝජනා දැමීමේ දී මම හිතනවා, ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගොඩක් අදහස් මේකට ඉදිරිපත් වෙයි කියලා. මේ අළුත් ක්‍රම වේදයට සංශෝධන ඉදිරිපත් කිරිමේදී මේක බස්නාහිර පළාත් සභාවටත්, රටටත් ලොකු ප්‍රයෝජනයක් වෙයි.

ඒකත් එක්කම මම දැක්ක දේ තමයි පැහැදිලිවම අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමෙක් කිව්වා වගේ හැම පක්ෂයකටම ඉදිරිපත් කරන්න වෙන්නේ, ගමේ අවංක කෙනාව. ඒ අවංක වැඩ කරන කෙනාව ඉදිරිපත් කළේ නැතිනම් තමන්ගේ පක්ෂය පරාජය වෙනවා. ඒ නිසා හැම වේලාවේම සංවිධායකතුමාට සිද්ධ වෙනවා, අවංක කෙනාව මේ සඳහා ඉදිරිපත් කරන්න. ඒ නිසා මම මතක් කරන්න ඕනෑ. පැහැදිලිවම එක්සත් ජාතික පක්ෂයෙන් පොඩි සඳහනක් කළා. මොකද අපේ අතිගරු ජනාධිපතිතුමාගේ කාලය දීර්ඝ කර ගැනීම සම්බන්ධව. පැහැදිලිවම මම පැහැදිලි මතයක ඉන්නවා. අතිගරු ජනාධිපතිතුමා කියන්නේ මේ රට වෙනුවෙන් අතිමහත් සේවාවක් කරපු කෙනෙක්. අද මේ විධියට අපට ආරක්ෂාවක් නැතිව, ඕනෑ තැනක යන්න පුළුවන් වෙලා තියෙන්නේ, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසා. මම නම් පැහැදිලිවම එතුමාට කැමතිතාක් කල් මේ රට පාලනය කරනවාට මම කැමතියි. මොකද එතුමා අතින් කවදාවත් වැරැද්දක් වෙනේන් නැහැ. එතුමා පොළොවේ පය ගහලා ජීවත් වුණු කෙනෙක්. ගම් මට්ටමින් ආපු කෙනෙක්. ඒ නිසා එතුමා අතින් කවදාවත් මේ වැරැද්ද වෙනේන් නැහැ. අද අපි පැහැදිලිවම අපේ පක්ෂ නායකයා හැටියට

[ ගරු ලලිත් එල්ලාවල]

අතිගරු ජනාධිපතිතුමා අපි ගන්න ඕනෑම තීන්දුවකට අපි එකඟ වෙනවා. මොකද එතුමා කවදාක්වත් වැරදි තීන්දුවක් ගන්නේ නැහැ කියලා අපි දන්න නිසා. ඒකට එක්සත් ජාතික පක්ෂය අද කනගාටු වෙන්න ඕනෑ වන දෙයක් නොවෙයි. අද අපේ පක්ෂයේ නායකයා නිවැරදි තීන්දු ගන්න නිසා තමයි හැම මැතිවරණයක්ම අපි විශිෂ්ටව ජයග්‍රහණය කරන්නේ.

එක්සත් ජාතික පක්‍ෂයේ අද ඔය සියළුම දේ වෙලා තියෙන්නේ, එක්සත් ජාතික පක්ෂයේ නායකයාගේ කාලය දිර්ඝ කර ගැනිමත් එක්ක. අද එතුමන්ලාට බැහැ එක්සත් ජාතික පක්ෂයේ නායකයාව කවදාක්වත් අයින් කරන්න. පක්ෂය ඔය මට්ටමට වැටිලා පක්ෂය දෙපිලක් බෙදිලා ගහගන්න කොට, වෙඩි තියා ගන්න කොටත්, නායකයාව අද ඉවත් කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ඒ නිසා අපේ නායකයා ඉතා අවංකව, ශ්‍රේෂ්ට කටයුතු කරන කෙනෙක් කියන ඒක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අපි දැන් පැහැදිලිවම මතක් කරන්න ඕනෑ, විශේෂයෙන්ම අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා හොඳ අදහස් කිහිපයක් දැරුවා. ඒකත් එක්කම එතුමා පොඩි විග්‍රහයකුත් කළා. ඇත්තටම මම මතක් කරන්න ඕනෑ, මේ බලු පොරයට ඔබතුමන්ලා වැටෙන්නේ නැත්තේ වෙන දෙයක් නිසා නොවෙයි. ඔබතුමන්ලාට බලු පොරයට වැටෙන්න තරම් ජන්දයක් පැහැදිලිවම නැහැ. ඒකයි ඒකට වැටෙන්නේ නැත්තේ. අනෙක් එක පැහැදිලිවම මතක් කරන්න ඕනෑ.

තමුන්නාන්සේලා අමතක කරන්න එපා. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක පෙරමුණක් හැටියට තමුන්නාන්සේලා කටයුතු කරන කොට හැම දිස්ත්‍රික්කයම තමුන්නාන්සේලාගේ ඉල්ලන අපේක්ෂකයෝ දෙන්නා හෝ තුන්දෙනා අංක තුන ගහගෙන වෙනම ගියේ. ඒ පොරයේදී තමුන්නාන්සේලා එතන හිටියා. තමුන්නාන්සේලා ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුණු නිසා තමුන්නාන්සේලාව අද එහෙමම ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ගරු මන්ත්‍රීතුමා ඔය විධියට ගියොත් බස්නාහිර පළාත් සභාවේ, මේ තියෙන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීකම් එක දෙකත් ඊළඟ මැතිවරණයේදී නැති වෙනවා කියන එක පැහැදිලිවම මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

එසේ මතක් කරමින් මේ යෝජනාවට පක්ෂව විපක්ෂව අදහස් දක්වපු සියළු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින්, නැවත අපේ කිර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට කියන්නේ ඉතාමත් වැඩි කාලයක් නොගිහිල්ලා මේ සංශෝධනය සහිත යෝජනාව ගෙන්න අපි සියළු දෙනාගේම අදහස් විමසලා, අපේ රටට, බස්නාහිර පළාත් සභාව ආදර්ශයක් වෙමුයි කියලා කියමින්, සියළු දෙනාටම ස්තුතිවන්න වෙමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන යෝජනාව පිළිබඳව සාකච්ඡාව මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තියෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රායානානුකූලව සිරිකමල් පිලිමියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මීළඟට තිබෙන්නේ. 2013.09.24 පැවැති අපේ සභා කටයුතු කාරක සභා රැස්වීමේ දී මේ යෝජනාවට පැයක් හා විනාඩි 07ක කාලයක් වෙන් කරලා තියෙනවා. දැන් වේලාව 12.35 නිසා එතුමාගේ

යෝජනාව ගැනීමට කාලයේ මදි තත්ත්වයක් තියෙනවා. සභාවේ අදහස් විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඊළඟ සභාවට ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාව එකඟයි. ඒ නිසා සභාවේ එකඟතාවය අනුව සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ලබන සභා වාරයට විවාදය ලබා දෙනවා. ඒ අනුව ගරු සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Hon. Sunil Jayamini - Leader of the House

සභාපතිතුමනි, *"මෙම සභාව දැන් කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.38 ට 2013 ඔක්තෝබර් මස 22 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.38 p.m till 9.30 a.m. on 22.10.2013*